# නර්තනය

# අතිරේක කියවීම් පොත

## 7 ශ්‍රේණිය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk
info@ne.lk

**නර්තනය**

**7 වන ශ්‍රේණිය**

**අතිරේක කියවීම් පොත**
(2016 සිට ක්‍රියාත්මක වේ)

**ප්‍රථම මුද්‍රණය 2016**

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

**වෙබ් අඩවිය** : www.nie.lk
**විද්‍යුත් තැපෑල** : info@nie.lk

*මුද්‍රණය* : මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය

# අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සඳහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් කාලෝචිත ව විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලබන අතර ඒ ඒ විෂයයන්ට අදාළ ව අතිරේක කියවීම් පොත් සම්පාදනය එහි එක් ප්‍රතිඵලයකි.

ඒ අනුව 6 සිට 13 ශ්‍රේණි විෂය නිර්දේශ හා ගුරු මාර්ගෝපදේශ පන්ති කාමරය තුළ සාර්ථක ව ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් අතිරේක කියවීම් පොත් සම්පාදනය කර ඇත.

අතිරේක කියවීම් පොත් මඟින් විෂය නිර්දේශයට අදාළ උද්ධෘත ගුරු ශිෂ්‍ය දෙපාර්ශ්වය වෙත සැපයීමෙන් අදාළ විෂය ධාරාව පහසුවෙන් අධ්‍යයනය කිරීමට පහසුකම් සැලසෙනු ඇති බව අපගේ විශ්වාසය යි.

මෙම අතිරේක කියවීම් පොත් පරිශීලනය කොට ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගන්නා ලෙස ගුරු භවතුන්ගෙන් ද, සිසු දරු දැරියන්ගෙන් ද ඉල්ලා සිටිමි.

මෙම අතිරේක කියවීම් පොත් ඔබ අතට පත් කිරීම සඳහා ශාස්ත්‍රීය දායකත්වය සැපසූ ආයතනික කාර්ය මණ්ඩලය සහ බාහිර විද්වතුන් වෙත මාගේ කෘතඥතාව හිමි වේ.

ආචාර්ය ජයන්ති ගුණසේකර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ඉගෙනුම නිරතුරු ව ඇගැයීම සමග සම්බන්ධ කළ හැකි ය. ඉහළ ඇගැයීම් සාධනයක් සඳහා අත්දැකීම පුළුල් විය යුතු ය. විහිද ගිය පුළුල් පරාසයක් සහිත ඉහළ ඇගැයීමක හිමිකම සැමට ම උපරිම සතුටක් උරුම කරයි. ඒ සඳහා සේවනයට අදාළ පුද්ගල, ස්ථාන, වස්තු, සිද්ධි බහුල වීම අවශ්‍ය ය.

එසේ ඉගෙනුම් අත්දැකීම් පුළුල් කිරීම සඳහා අතිරේක සම්පත් පොත් සකස් කිරීමට හැකිවීම ජාතික අධ්‍යාපන ආයතනයට සතුටකි. ඒ සඳහා කැප වී ක්‍රියා කළ සැමට අපගේ ස්තුතිය පිරිනැමේ.

ශිෂ්‍ය ප්‍රජාව මෙම අතිරේක සම්පත් පොත පරිහරණය කරමින් එමගින් ඉදිරිපත් කරන වෙනත් දැනුම් මූලයන් ද සමීප කර ගතහොත් ඉහළ සාධනයක් වෙත ළඟා වීමට හැකි වීම නිසැක ය. එබැවින් ශිෂ්‍ය, ගුරු දෙගුරු, සැමගේ අවධානය යොමු විය යුතු ය. මෙම අතිරේක සම්පත් පොත් තවදුරටත් සංවර්ධනය කිරීමට උක්ත සැමගේ අවධානය යොමු වීම ද අප විසින් අපේක්ෂා කෙරේ. අදාළ යම් කරුණක් වෙතොත් අප දැනුම්වත් කරන ලෙස ඉල්ලා සිටින අතර දැයේ දූ දරුවන්ගේ ඉගෙනුම් පරාසයන් පුළුල් වෙමින් අභිමානවත් දැයක් ගොඩ නැගේ වා' යි ප්‍රාර්ථනා කරමි.

ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ හර හෙවත් ප්‍රධාන විෂයයන් ලෙස පිළිගත් මවුබස, ගණිතය, විද්‍යාව වැනි විෂයයන් සඳහා බොහෝ කලෙක සිට විෂය නිර්දේශයට සමගාමී ව ගුරු මාර්ගෝපදේශයට (Teacher Guide) අමතර ව පෙළ පොත් (Text books) භාවිතයේ පවතී. ඒ අනුව ගුරු මාර්ගෝපදේශ ගුරුවරයාට ද, පෙළ පොත සිසු පරිහරණයට ද ලබා දෙමින් සිසුන් තුළ නැණ පහන් ඉතා උසස් ලෙස දල්වන්නට සැවොම ක්‍රියාත්මක වෙති.

අධ්‍යාපන ප්‍රතිපත්ති මඟින් තවමත් හර විෂයයක් ලෙස නො පිළිගත් සෞන්දර්ය විෂයය සුභාෂිත කතු කී ලෙස ''ගුණ නැණ බෙලෙන් යුතු පුතු ම ය ඉතා ගරු'' යන පෙදෙහි 'ගුණ' වඩනට දෙනු ලබනුයේ අද්විතීය දායකත්වයෙකි. නැණ වැඩෙනුයේ විෂය බද්ධ දැනුම හා හැකියා වැඩුම මුල් කොට ය. මිනිසා ගුණවත් නම් මානව යහපැවැත්මට, පරිසරයට සොබා දහමට සංවේදී පුරවැසියෙක් බව හේ චර්යාවෙන් ම පළ කරයි. 'ගුණ' පළමු කොට ද, නැණ ඊට සරිලන පමණින් ද යුතු වූ පුරවැසියකු අද මෙදෙසට වඩාත් අවැසි ය. ඒ ගරු කටයුතු පුරවැසියා තැනුමට නම් සෞන්දර්ය විෂයයන් හර විෂය කුලකයෙහි තබනු වටී. ඒ බැවි බොහෝ කලෙක සිට හඳුනා මෙම විෂය ක්ෂේත්‍රයේ නැඟුම උදෙසා වෙහෙසෙන අපි මෙතෙක් පිළිගැනුමට ලක්ව ඇති හර විෂයයන්ට සේ ම මීට ද සිසු කැල සඳහා පෙළ පොත් නිපදවීමෙහි අගය පෙන්වා දුන්නෙමු. අපි තව මත් ''හර'' නොවන බැවින් ඊට ඉඩකඩක් නො ලද මුත් ගුරුවරයාට ඉගැන්වීමට උපකාරක අත්පොතක් ලෙස මෙවන් පොතක් පද්ධතියට පිළිගැන්වීමට නම් ඉඩ ප්‍රස්තාව ලදිමු. මින් ඉටු වනුයේ පෙළ පොතෙහි කාර්යභාරය ම නො වන මුත් මෙය සිසු පසට ද, ගුරු පසට ද, ඉමහත් ශක්තියක් හා ජාතික වශයෙන් සම්මත, සමපාත බවක් ඇති කිරීමට නොමඳ ඵලදායක සම්පතක් වනු ඇත.

පන්තිකාමරයට හරවත් වූ මෙම ඉගෙනුම් සම්පත හෙට දවසේ පද්ධති ගත කිරීමෙන් අප සපුරා ගන්නට අපේක්ෂිත සුවිශේෂ ඵල මෙසේ වේ.

1. ගුරුවරයාට අත්‍යවශ්‍ය විෂය කරුණු එක ගොනුවක් කොට සපයා දීමෙන් ගුරු කාර්යක්ෂමතාව ඉහළ නැංවීම.
2. ගුරු මාර්ගෝපදේශයෙහි සවිස්තරාත්මක ව ඉදිරිපත් නො කෙරෙන විෂය අන්තර්ගතය මෙම පොත ඇසුරින් ලබාදීම.
3. ගුරු මාර්ගෝපදේශය ප්‍රමාණයෙන් පිටු විශාල ගණනකට යාම වැළැක්වීම හා ඊට අත්‍යවශ්‍ය ම කරුණු පමණක් ඇතුළත් කිරීම.
4. මතභේදයන්ට තුඩු දෙන විෂය කරුණු වෙතොත් ඒ පිළිබඳ ජාතික වශයෙන් ඒකමතික භාවයක් ඇති කිරීමට අවශ්‍ය නිශ්චිත කරුණු/තර්ක සම්පාදනය කිරීම.
5. විෂය කරුණුවල සමතුලිත බව හා සීමා නිර්ණයන්හි ප්‍රමිති ගත බව ඇති කිරීමෙන් ඇගැයීම් කාර්ය පහසු කරවීම.
6. ගුරුවරයාගේ දැනුම නිර්දේශයෙන් මඳක් ඔබ්බට ප්‍රසාරණය කරමින් විෂයානුබද්ධ දැනුම පිළිබඳ විශ්වසනීයත්වය තහවුරු කිරීම.
7. ගුරු සිසු දෙපිරිසට ම ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රියාවලිය රසවත් හා හරවත් අත්දැකීමක් බවට පත් කිරීම.

ඒ සා ඉමහත් සම්පතක් ලෙස මෙම පොත අප දෙස දරු කැලගේ යහ ගුණ නැණ වඩන්නට මෙන් ම රසවත් ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර ගන්නට ගුරු ඔබට පිහිට වනු ඇත. ගුරු ඔබේ ක්‍රියාශීලී බව හා දැනුම්වත් බව මින් තව තවත් වැඩේ වා! එමෙන් ම වත්මන් දරු කැලට සෞන්දර්ය විෂයය ඉගෙනුම රසවත් හා හරවත් ජීවිත අත්දැකීමක් වේ වා! යි මම පතමි.

ශාස්ත්‍රපති සුදත් සමරසිංහ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වැ/බ)
විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

# විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා**
**අනුමැතිය** : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය
ජාතික අධ්‍යාපන ආයතනය

**අධීක්ෂණය** : ශාස්ත්‍රපති සුදත් සමරසිංහ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වැ. බ.)
විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය අධීක්ෂණය** : එස්. වර්ණසිංහ
අධ්‍යක්ෂ (වැ. ආ.)
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**ව්‍යාපෘති නායක** : බී. මරීනා ශිරාන්ති ද සොයිසා
කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**ලේඛක මණ්ඩලය**
**අභ්‍යන්තර** : එස්. වර්ණසිංහ - අධ්‍යක්ෂ (වැ.ආ.)
බුද්ධි කල්‍යාණි මුතුකුමාරණ - ජ්‍යෙ. කථිකාචාර්ය
බී. මරීනා ශිරාන්ති ද සොයිසා - කථිකාචාර්ය

**බාහිර** : ගුණසේන රාජපක්ෂ - ජ්‍යෙ. කථිකාචාර්ය (විශ්‍රාමික)
සිරිල් මීගම - ජ්‍යෙ. කථිකාචාර්ය (විශ්‍රාමික)
සෞන්දර්ය අධ්‍යාපන ගුරු විදුහල, ගිරාගම
සමන් පෙරේරා
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - කැලණිය
කේ සුසන්ත ගුණවර්ධන
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - දෙනුවර අධ්‍යාපන කලාපය
යූ. ජී. ප්‍රේමරත්න
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - හලාවත අධ්‍යාපන කලාපය (විශ්‍රාමික)
දම්මිත් ප්‍රනාන්දු - ගුරු උපදේශක හා විෂය සම්බන්ධීකාරක
කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර
චන්ද්‍රිකා මැණිකේ - ගුරු උපදේශක
කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ

ජේ.එම්.ඩී. ශ්‍යාමා - ගුරු උපදේශක
කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ
එම්. හේවාවිතාරණ
ගුරු සේවය - බ.ප. විද්‍යාකර බාලිකා විද්‍යාලය - මහරගම
ඒ.එම්. බියංකා එම්. අබේසිංහ
ගුරු සේවය - බ.ප. ධර්මපාල විද්‍යාලය - පන්නිපිටිය
එම්.එම්.එස්.පී.කේ. මාරසිංහ
ගුරු සේවය - හංවැල්ල රාජසිංහ ම.ම. විද්‍යාලය - හංවැල්ල
දීප්ති පියසේකර
ගුරු සේවය - ආනන්ද බා.ම.වි. - කොළඹ
එම්.එම්. සමන්ත විජේසිරි
ගුරු සේවය - දික්වැල්ල ම.වි. - දික්වැල්ල

**විෂය සංස්කාරක මණ්ඩලය** : ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මුදියන්සේ දිසානායක
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වික්‍රමසිංහ බණ්ඩාර
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අසෝකා දිසානායක
ආචාර්ය ශ්‍රියානි රාජපක්ෂ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සුනිලා රූපස්සර
සෞන්දර්ය කලා වි.වි. - කොළඹ 07

**භාෂා සංස්කරණය** : මහාචාර්ය රත්න විජේතුංග - විශ්‍රාමික
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
එස්.ඕ. ප්‍රනාන්දු - අධ්‍යක්ෂ (විශ්‍රාමික), ජා.අ.ආ.
ශ්‍රීනාත් ගණේවත්ත මහතා - භාෂා සංස්කාරක

**කංචුක නිර්මාණය** : ඊ.එල්.ඒ.කේ. ලියනගේ මහතා
ජාතික අධ්‍යාපන ආයතනය

**පරිගණක වදන් සැකසුම**: ඩී.සී. ජයකොඩි මහත්මිය
ජාතික අධ්‍යාපන ආයතනය

**විවිධ සහාය** : දීපා ශිරෝමණී මෙණෙවිය
කේ.ජී. පෙරේරා මහතා
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

# පටුන


| | පිටුව |
|---|---|
| **අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය** | i |
| **නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය** | ii |
| **හැඳින්වීම** | iii |
| **ලේඛක මණ්ඩලය** | iv - v |
| **පටුන** | vi |

**1 පරිච්ඡේදය**

1.0 පරිසරය ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණය 1

**2 පරිච්ඡේදය**

2.0 නර්තන ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය 8

**3 පරිච්ඡේදය**

3.0 සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ 26

**4 පරිච්ඡේදය**

4.0 ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනාවල පසුබිම හා ගායනය 32

**5 පරිච්ඡේදය**

5.0 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම 37

**6 පරිච්ඡේදය**

6.0 විවිධ කලාංගවල සෞන්දර්යාත්මක වටිනාකම් 49

**7 පරිච්ඡේදය**

7.0 අත්දැකීම් ඇසුරු කරගනිමින් ප්‍රාසංගික කලාංග නිර්මාණය 54

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 58

# 1 පරිච්ඡේදය

## 1.0 පරිසරය ඇසුරු කර ගනිමින් නර්තන නිර්මාණය

### වැසි දිනෙක දක්නට ලැබෙන ලක්ෂණ



''සුළං තදයි විදුලිය ද කොටයි
හෙණ හඬ පැතිරෙයි
මහ වලාකුළක් නොවැ එන්නේ ..........''

මේ ගීත ඛණ්ඩයෙන් කියැවෙන අවස්ථාව චිත්තරූප සහිත ව සිහියට නඟා ගන්න. ඒ අනුව ඔබ සිහියට නඟා ගත්තේ වැසිබර අවස්ථාවක් බවට පැහැදිලි ය.

වැස්ස යනු, ස්වාභාවික පරිසරයෙන් අපට ලැබෙන සම්පතකි. එය අසිරිමත් ක්‍රියාවලියකි. වැසි සහිත දිනයෙක ස්වභාවයෙන් ම වලාකුළු අඳුරු පැහැයකින් යුක්ත වන අතර, පරිසරය ද සතුන්ගේ ශබ්ද, නාද, චලන විවිධ වෙනස්කම් ප්‍රදර්ශනය කරයි.

- කුඹී ගුලක් විසිරීම
- මෙරුන් පියඹා යෑම
- ගෙම්බන්ගේ කෑගැසීම
- වැහිලිහිණින් අහසේ පියඹා යෑම

රිද්මයකට අනුව චලනය වන ගස්වැල්, සුළඟේ වේගවත් බව හා මුසු වී පරිසරයේ රළු බවක් හා භයංකර බවක් ඇති කරයි. අහස කළු වලාවලින් බර වී වැහි බිඳු එකිනෙක බිමට පතිත වෙයි. එවන් අවස්ථාවක් සිහියට නඟමින් වැස්සේ අසිරිය සෞන්දර්යාත්මක ව විඳින්න. ඔබ වගේ ම ගස්වැල්, සතුන්, ඇළදොළ, ගංගා, කෙත් වතු, වැස්සේ ආස්වාදය විඳියි. සුළඟ, ගස්වැල් ඇඹරීම, හෙණහඬ, විදුලිය කෙටීම, වතුර ගලායාම වැස්සත් සමග ක්‍රමික ව ඇති වන ක්‍රියාවලියකි.

පන්ති කාමරය තුළ ඔබට පැවරෙන කාර්යය වන්නේ වැස්සක අසිරිය නර්තන නිර්මාණයකින් ඉදිරිපත් කිරීමයි. ඉහත දක්වා ඇති අවස්ථා නිරූපණය සඳහා සුදුසු චලන යොදා ගැනීමේ දී පැනීම්, කැරකීම්, පෙරළීම්, භාව නිරූපණ යොදා ගැනීම වැදගත් වේ.

| | | | |
|---|---|---|---|
| උදා : | සුළඟ | - | කැරකීම |
| | ගස්වැල් ඇඹරීම | - | ස්ථිතික චලන |
| | විදුලි කෙටීම | - | පැනීම හා සම්බන්ධ චලන |
| | හෙණ හඬ | - | භාව නිරූපණ |
| | වතුර ගලා යාම | - | බිම පෙරළීම, සුරල් පෑගීම, දෑත් චලනය කිරීම |

ඉහත චලන යොදා ගැනීමේ දී රිද්මය හෝ තාලය හෝ ඇසුරු කර ගැනීම වැදගත් වේ.

**ක්‍රියාකාරකම :**

- වැස්ස ගැන කියැවෙන ගීත නම් කරන්න.
- වැසි දිනයෙක දී ස්වාභාවික පරිසරය තුළ ඇති වන වෙනස්කම් ලියන්න.
- එම වෙනස්කම් නර්තන නිර්මාණයකින් ඉදිරිපත් කරන්න.
- වැසි දිනයෙක පරිසරයේ දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ හඳුනා ගනිමින් සත්ත්ව චරිත කීපයක් නිරූපණය කරන්න.

## භාව ප්‍රකාශ වන පරිදි චරිත නිරූපණය

- **භාව ප්‍රකාශන ''උත්සාහය'' නැමති ස්ථායී භාවය**



ඉහත පින්තූරය හොඳින් නිරීක්ෂණය කරන්න. මෙම පින්තූරයේ සිටින කඹ අදින්නන් යමක් ඇදීමට වෑයමක් දරන බව පෙනේ. එය ඔහුගේ සිත තුළ ඇති වූ ''උත්සාහ'' නැමති භාවය වෙයි. එසේ සිත තුළ ඇති භාව අංග, ප්‍රත්‍යංග හා උපාංග ප්‍රයෝජනයට ගනිමින් භාව නිරූපණය කෙරෙන නර්තන නිර්මාණ කිරීමේ දී භාව ප්‍රකාශනය ඉතා වැදගත් වේ.

අංග, ප්‍රත්‍යංග, උපාංග යොදා ගනිමින් කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා වේගය, බර, සැහැල්ලු බව, කාලය, දුර පිළිබඳ ව අවධානය යොමු කළ යුතු ය.

අංග, ප්‍රත්‍යංග, උපාංග → කාලය, වේගය, ශක්තිය, දුර → භාව නිරූපණ

ඉහත සටහනට අනුව භාව නිරූපණ ඉදිරිපත් කිරීමේ දී ''උත්සාහ'' නමැති භාවය සඳහා මස්පිඬු තද කිරීම, තොල් තදින් හකුළා ගැනීම, ඇස් කුඩා කිරීම, දත් ඇඳි එකට තද කිරීම, කම්මුල් දෙපසට විහිදීම වැනි චලන සිදුවේ.



ඉහත භාව නිරූපණයට අනුව ''උත්සාහ'' භාවයෙන් නිරූපණය වන්නේ වීර රසය යි.

**ක්‍රියාකාරකම** : 'උත්සාහ' නමැති භාවය ප්‍රදර්ශනය කිරීමට යෝජිත ක්‍රියාකාරකම සඳහා උපදෙස්

- කඹ ඇදීමේ තරගයකට සහභාගි වන සිසුහු දෙපිරිසකි. ඔවුහු තම කණ්ඩායම දිනවීමට බලවත් උත්සාහයක නිරත වෙති. මෙම සිද්ධිය භාවාත්මක ව ඉදිරිපත් කරන්න.

- තරගයකට ඉදිරිපත් වන පාපැදි ධාවකයෝ කීප දෙනෙකි. ඔවුන්ගේ ගමන් මගේ දී කඳු සහිත ස්ථානයක් හමුවේ. එහි දී පාපැදිකරුවන් තම පාපැදිය හසුරුවන ආකාරය ''උත්සාහ'' භාවය නිරූපණය වන ආකාරයට ඉදිරිපත් කරන්න.

- කැලයේ දර කැඩීමට ගිය පුද්ගලයෙක් හදිසියේ වළකට වැටෙයි. ඉන් ගොඩ ඒමට දැඩි උත්සාහයක නිරත වේ. අවසානයේ වළ තුළට දැමූ ආධාරකයක එල්ලී ඔහු ගොඩට එයි.

- බර එසවීමේ ක්‍රීඩාවේ නිරත වන ක්‍රීඩකයෙකි. ඔහු දෙවරක් ම බර එසවීමට ගත් උත්සාහය අසාර්ථක විය. එහෙත් තෙවෙනි වර මහත් ඕනෑකමින් හා උනන්දුවෙන් එම කාර්යය ඉටු කළේ ය. මෙය උත්සාහ නමැති භාවය පිළිබිඹු කෙරෙන අයුරින් නිරූපණය කරන්න.

## තාලම් නැටුමේ සුවිශේෂ ලක්ෂණ හා නර්තන නිර්මාණය

තාලම්පට දෑතට ගෙන වාදනය කරමින් නර්තනයේ යෙදීම තාලම් නැටුමේ විශේෂ ලක්ෂණය යි. ගායනයේ දී හා නර්තනයේ දී තාල තැබීමට යොදා ගන්නා තාලම්පට තාලම් නැටුමේ දී රංග භාණ්ඩයක් ලෙස යොදා ගනියි. එමෙන් ම බොහෝ ගැමි නැටුම් ජීවන වෘත්තියකට සම්බන්ධ වුව ද තාලම් නැටුම එසේ නොවේ. එය විනෝදාස්වාදය සඳහා ම නිර්මාණය වූවකි. තාලම් කවි නිර්මාණය වී ඇත්තේ සරල භාෂාවෙන් වන අතර, ඇතැම් ඒවා ප්‍රතිවාදීන්ට අභියෝගාත්මක ස්වරූපයෙන් ද රචනා වී ඇත.

එනවා ඇඳුරෝ තරගෙට කීම කියාගෙන
දනවා හදවත තාලම උපත ඇසූ තැන
මොනවා වත් දන්නේ නැති ව සබයට ආ තැන
දෙනවා මගෙ තාලම්පට උපත කියාදෙන

තාලම් නැටුම පිරිමි කාන්තා දෙපක්ෂය විසින් ම රඟ දක්වනු දැකිය හැකි ය. පිරිමි පක්ෂය විසින් රඟ දක්වන විට තාණ්ඩව බවක් දක්නට ලැබේ. තාලම්පට දෑතට ගෙන විවිධ ක්‍රම ශිල්ප උපයෝගී කර ගනිමින් හරඹ දැක්වීම මෙහි සුවිශේෂ ලක්ෂණයකි.

තාලම් කවි විවිධ තාල රූප අනුව ගායනය කරමින් නර්තනය කළ හැකි ය.

**මාත්‍රා 3 තාලය**

අගේ වඩන මගෙ තාලම් හරඹ බලන්නේ
වගේ නො දැන ඇයි නුඹලා කීමට එන්නේ
කගේ ගිල්ල ලෙස බැරිවෙයි නුඹට බොලන්නේ
මගේ දෑත තාලම්පට හරඹ බලන්නේ

**මාත්‍රා 4 තනි තිත**

සඳවට තරුවැල් ඇවිදින් කල එළි සද්දේ
මඳකොට පවසමි ඇවිදින් ඇරඹුණ යුද්දේ
යුදයට වසවතු ඇවිදින් පැරදුණ යුද්දේ
බඳවට කැරකෙන මගේ තාලම්පට සද්දේ

අහසේ තාලම් තාංගු තාලම් - සඳවට කැරකී යයි තාලම්
පොළොවේ තාලම් තාංගු තාලම් - වැලියට සැඟවී යයි තාලම්
මුහුදේ තාලම් තාංගු තාලම් - රැළි යට සැඟවී යයි තාලම්
අපගේ තාලම් තාංගු තාලම් - බඳවට කැරකී යයි තාලම්

තාලම් නැටුම සඳහා සරල පද යොදා ගනිමින් ගායනය හා වාදනය සහිත ව සාමූහික ව නර්තනයේ යෙදේ.

**ක්‍රියාකාරකම :**

- විවිධ තාල රූපවලට තාලම් කවි ගායනය කරන්න.
- තාලම් නැටුමකට සුදුසු පද හතරක් නිර්මාණය කරන්න.
- රංග රටා හා සම්බන්ධතා ඇසුරු කොට ගෙන සාමූහික ව තාලම් නර්තනයක් ඉදිරිපත් කරන්න.

## කුලු නැටුම් හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හා නර්තන නිර්මාණය

කෘෂිකාර්මික ජන සමාජයේ අත්‍යවශ්‍ය උපකරණයක් ලෙස භාවිත වන කුල්ල ඇසුරු කර ගනිමින් නිර්මාණය කොට ඇති අලංකාර ගැමි නැටුමක් ලෙස කුලු නැටුම හඳුන්වා දිය හැකි ය.

කුල්ල කමතේ දී භාවිත කරනු ලබන අතර මුළුතැන් ගෙයි උපකරණයක් ලෙස නිවසේ දී භාවිත කරයි. කමතේ දී බැත එකතු කිරීම, කාටුව පිස හැරීම, බැත හුළං කිරීම, ගල්වැලි සහලින් ඉවත් කිරීම සඳහා පූ කිරීම, පිරිසිදු කළ බැත ගෝනිවලට පිරවීම ආදි කාර්යයන්හි දී කුල්ල යොදා ගැනේ. කමතේ දී පිරිමි පාර්ශ්වය කුල්ල භාවිත කරන අතර මුළුතැන්ගෙයි වැඩකටයුතුවල දී එනම් වී පෙළීම, සහල් පෙළීම, සහල් පූ කිරීම ආදි කටයුතුවල දී කාන්තාවන් විසින් කුල්ල භාවිත කරනු ලැබේ.

කුලු නැටුම සඳහා යොදා ගන්නා කවි විවිධ තාල රූප හා විවිධ නාදමාලා අනුව සරල ගැමි බස් වහරකින් නිර්මාණය වී ඇත. එමෙන් ම මේ සඳහා රත්නමාලී දෙවිදුව සම්බන්ධ රන්තෙලඹු වර්ණනාවේ එන කවි හා රත්නවල්ලී කවි ද යොදා ගනු ලැබේ.

රටා දමා කුල්ල සකස් කිරීම කොතරම් අපහසු කාර්යයක් දැයි එහි එන සමහර ගායනාවලින් පැහැදිලි වේ.

කැලේ ගොසින් බට පතුරු කපන්නේ
පළා පුරුක් හැර අව්වේ දමන්නේ
නමා දෙකොන මුළු අස්සේ පුරන්නේ
රටා දමාලයි කුල්ල වියන්නේ

එසේ සකසා ගත් කුල්ල නර්තනයේ දී විවිධ සැරසිලි හා වර්ණ යොදා අලංකාර කර ගනියි.

කෘෂි කර්මාන්තයේ දී කුල්ල භාවිතයට ගන්නා අවස්ථා ඉහතින් දක්වා ඇත. එම අවස්ථා පදනම් කර ගනිමින් කුලු නැටුම නිර්මාණය වී ඇත. විශේෂයෙන් කාන්තාවන් සඳහා වඩාත් යෝග්‍ය ගැමි නැටුමක් ලෙස කුලු නැටුම හැඳින්විය හැකි ය. ඉතා සරල වූත්, අලංකාර වූත් සරල මාත්‍රා (පද) යොදා ගනිමින් නර්තනයේ යෙදිය හැකි සාමූහික නර්තන අංගයකි.

අවකාශ භාවිතය සැලකිල්ලට ගෙන විවිධ රංග රටා ගොඩ නගමින් කුල්ලෙන් කරනු ලබන කාර්යයන් අනුකරණාත්මක ව නර්තනය සඳහා යොදා ගත හැකි ය.

වර්තමානයේ ප්‍රසංග වේදිකාව සඳහා කුලු නැටුම නිර්මාණය කිරීමේ දී සංකීර්ණ තාල රටා, මාත්‍රා (පද) හා රංග රටා යොදා ගනිමින් නර්තනය කරන අයුරු දක්නට ලැබේ.





ඉහත පින්තූර නිරීක්ෂණය කිරීමේ දී කුල්ල භාවිත කරමින් නර්තනය සිදු කරන අයුරු පෙනේ.

- කුලු රැගෙන සබයට එන කාන්තාවෝ
- කුල්ලෙන් වී හුළං කිරීම
- කුල්ලට වී පිරවීම
- අතින් අත මාරු කර යැවීම
- වී පෙළීම, පූ කිරීම
- පොළන ලද වී පසකට දැමීම
- කාර්ය නිමා කිරීමේ දී ලද සතුට ආදි අවස්ථාවන් කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

කුලු නැටුම නිර්මාණයේ දී පහත සඳහන් කුලු කවි ගායනය සඳහා භාවිතයට ගත හැකි ය.

**මාත්‍රා 3 තාලය**

1. ඈත සිටන් එන්නී සෙල්ලි සෙල්ලියේ
   මෑත සිටන් එන්නී සෙල්ලි සෙල්ලියේ
   අතේ පයේ ගිගිරි ද සෙල්ලි සෙල්ලියේ
   කුලු සරඹෙට එනව ද රත්න වල්ලියේ

2. බන්දවාන කුලු යතුරු තනාලා
   ඇන්දවාන අළු යන්තරේ ඇඳලා
   කැන්දවාන දෙදෙනෙකුට කියාලා
   කන්ද බැඳෙන බැත පැහැපත් කරලා

| | | |
|---|---|---|
| 3. | ළමා ලියෝ ගවසා මල් වරල | පිට |
| | දමා කරට මුතුපොට අත වළලු | වට |
| | පෙමා වඩන ලෙස සරසා ඔසරි | පොට |
| | පමා නොව රඟත් කුලු ගෙන සබේ | පිට |

**ක්‍රියාකාරකම :**

1. විවිධ තාලරූප අනුව කුලු කවි ගායනය කරන්න.
2. කුල්ල භාවිත කරමින් කුලු නැටුමට සුදුසු පද හතරක් නිර්මාණය කරන්න.
3. විවිධ රංග රටා භාවිත කරමින් කුලු නැටුමක් නිර්මාණය කරන්න.
4. අවකාශය නිසි ලෙස භාවිත කරමින් සාමූහික ව කුලු නැටුමක් ඉදිරිපත් කරන්න.

# 2 පරිච්ඡේදය

## 2.0 නර්තන ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය

### නම්‍යතා අභ්‍යාස

නර්තනයට අවශ්‍ය හැඩතල සකස් කර ගැනීම සඳහා නම්‍යතා අභ්‍යාස ඉතා වැදගත් වෙයි. එබැවින් 6 ශ්‍රේණියේ දී උගත් නම්‍යතා අභ්‍යාසයන්ට අමතර ව තවත් අභ්‍යාස හතරක් සකස් කර ගැනීම අවශ්‍ය වේ. මෙම අභ්‍යාස කිරීමේ දී බෙර වාදනයට හෝ සංගීත ඛණ්ඩවලට හෝ අනුව ඒවා සිදු කිරීමෙන් ඒවා අභ්‍යාස කිරීම පහසු වේ.

උදා : 1. 1, 2, 3, 4 වශයෙන් ඉදිරියට හා පසුපසට ගමන් කිරීම.
5, 6, 7, 8 අංකවල දී ඉඳ ගැනීම හා නැගිටීම

ඉහත ක්‍රියාකාරකම් කිරීමේ දී හස්ත චලනය කිරීම හිස සහ දෙඇස් ක්‍රියා කරවීම, නර්තන සම්ප්‍රදායයන් අනුව දෑත් උපයෝගී කර ගැනීම වඩාත් සුදුසු ය. විවිධත්වයක් ඇතිවන පරිදි මෙවැනි අභ්‍යාස හතරක් සකස් කරගත හැකි ය. කැරකීම, උඩ පැනීම, ඉඳ ගැනීම ඒ ඒ සම්ප්‍රදායයට අනුව තාලයකට හා බෙරපද වාදනයට අනුව සිදු කිරීම මෙයින් බලාපොරොත්තු වේ.

### අභ්‍යාසය සිදු කරන අවස්ථා

- පන්ති කාමර තුළ නර්තනය ආරම්භයේ දී

### නම්‍යතා අභ්‍යාසවල නිරත වීමේ වැදගත්කම

- නර්තනය සඳහා අවශ්‍ය ශාරීරික සමබරතාව හා නිවැරදි හැඩතල සකස් කර ගැනීම.
- මනා සෞඛ්‍ය තත්ත්වයකින් හෙබි නීරෝග පුද්ගලයකු වීම.
- සතුටින් නම්‍යතා අභ්‍යාස කිරීම නිසා මානසික සුවයක් ඇති වීම.
- ශාරීරික ප්‍රසන්න බව ඇති වීම.
- රස වින්දන හැකියාව වර්ධනය වීම.
- අභියෝගවලට මුහුණ දීම හා දරා ගැනීමේ හැකියාව ඇති වීම.
- කායික සංවර්ධනයක් ඇති වීම.

## මූලික සරඹ ඉදිරිපත් කිරීම.

### උඩරට - පාසරඹ

**හතර වන පාසරඹය (උඩරට)**

සරඹ නාමය : සිවු අඩිය (හතර වන පාසරඹය)
සරඹ පදය : තෙයිත තෙයිත තෙයි තෙයියත් තාම්
තාලය : මැදුම් තනි තිත (මාත්‍රා 3)

| | / 1 2 3 | / 1 2 3 | / 1 2 3 | / 1 2 3 |
|---|---|---|---|---|
| විලම්භ | තෙයි - ත | තෙයි - ත | තෙයි - තෙයි | යත් තාම් - |
| මධ්‍ය | තෙයි තතෙ යිත | තෙයි තෙයියත් තාම් | තෙයි තතෙ යිත | තෙයි තෙයියත් තාම් |

පළමුවෙන් පදය තාල තබමින් කීම වැදගත් වේ. මෙහි දී තාල තැබීම සඳහා තාලම් පට භාවිත කළ යුතු අතර නිවැරදි ව ''තෙයි'' හඬ ඉස්මතු වන පරිදි තාලම් පට වාදනය කළ යුතු ය. අනතුරු ව ගුරුවරයා නර්තනය කර පෙන්වීමෙන් නිවැරදි අංගහාර හඳුනා ගෙන අභ්‍යාස කළ හැකි ය. (සමගුණ, දෙගුණ යන ලයවලට අභ්‍යාස කිරීම අත්‍යවශ්‍ය වේ.)

**පස් වන පාසරඹය (උඩරට)**

සරඹ නාමය : දෑල අඩිය
සරඹ පදය : තෙයි ති තා තෙයි
තාලය : මහ තනිතිත (මාත්‍රා 4)

| | / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 |
|---|---|---|---|---|
| විලම්භ | තෙයි - - ති | තා - තෙයි - | තෙයි - - ති | තා - තෙයි - |
| මධ්‍ය | තෙයි ති තා තෙයි | තෙයි ති තා තෙයි | තෙයි ති තා තෙයි | තෙයි ති තා තෙයි |

**හය වන පාසරඹය (උඩරට)**

සරඹ නාමය : පසු පෙර අඩිය
සරඹ පදය : තා තෙයියත් තා තෙයියත් තා තෙයියත් තා තෙයි//
(ඉදිරියට පිටුපසට)
තාලය : මැදුම් තනි තිත

| | / 1 2 3 | / 1 2 3 | / 1 2 3 | / 1 2 3 |
|---|---|---|---|---|
| විලම්භ | තා තෙයි යත් | තා තෙයි යත් | තා තෙයි යත් | තා තෙයි - |
| මධ්‍ය | තාතෙයි යත්තා තෙයියත් | තාතෙයි යත්තා තෙයි | තාතෙයි යත්තා තෙයියත් | තාතෙයි යත්තා තෙයි |

**හමාර කිරීමේ පදය**

අවසානයේ නටනු ලබන හමාර පදය සෑම පාසරඹයකට ම පොදු ය.

හමාර පදය : තෙයියත් තෙයියත් තෙයියත් තාම් තෙයි තාම් තෙයි තෙයි තත් තත් තා

## පහතරට - පාසරඹ

**හතර වන පා සරඹය : තෙයි කිට/// තෙයි දොම්**
තාලය : මහතනි තිත 4/4

| | / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 |
|---|---|---|---|---|
| විලම්භ | තෙයි - කි ට | තෙයි - කි ට | තෙයි - කි ට | තෙයි - දොම් - |
| මධ්‍ය | තෙයි කිට තෙයි කිට | තෙයි කිට තෙයි දොම් | තෙයි කිට තෙයි කිට | තෙයි කිට තෙයි දොම් |

**පස් වන පා සරඹය : තෙයි කිට තෙයි තා //**
**තෙයි කිට/// තෙයි දොම්**

| | / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 |
|---|---|---|---|---|
| විලම්භ | තෙයි - කි ට | තෙයි - තා - | තෙයි - කි ට | තෙයි - තා - |
| | තෙයි - කි ට | තෙයි - කි ට | තෙයි - කි ට | තෙයි - දොම් - |
| මධ්‍ය | තෙයි කිට තෙයි තා | තෙයි කිට තෙයි තා | තෙයි කිට තෙයි කිට | තෙයි කිට තෙයි දොම් |

**හය වන පා සරඹය - තෙයි තෙයි තා// තෙයි කිට තා//**

| | / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 |
|---|---|---|---|---|
| විලම්භ | තෙයි - තෙයි - | තා - - - | තෙයි - තෙයි - | තා - - - |
| | තෙයි - කි ට | තා - - - | තෙයි - කි ට | තා - - - |
| මධ්‍ය | තෙයි තෙයි තා - | තෙයි තෙයි තා - | තෙයි කිට තා - | තෙයි කිට තා - |

## සබරගමු - මණ්ඩි පද

**හතර වන මණ්ඩි පදය - තෙයි තෙයියත් දොම් තෙයි ගත තෙයියත් දොම්**

| | / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 |
|---|---|---|---|---|
| විලම්භ | තෙයි - තෙයි - | යත් - දොම් - | තෙයි ගත තෙයි - | යත් - දොම් - |
| මධ්‍ය | තෙයි තෙයි යත් දොම් | තෙයිගත තෙයි යත් දොම් | තෙයි තෙයි යත් දොම් | තෙයිගත තෙයි යත් දොම් |

**පස් වන මණ්ඩි පදය - තෙයි තෙයි තත් තක තෙයිතක තෙයි තක**

| | / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 |
|---|---|---|---|---|
| විලම්භ | තෙයි - තෙයි - | තත් - ත ක | තෙයි - ත ක | තෙයි - ත ක |
| මධ්‍ය | තෙයි තෙයි තත් තක | තෙයිත තක තෙයි තක | තෙයි තෙයි තත් තක | තෙයි තක තෙයි තක |

**හය වන මණ්ඩි පදය - තෙයිත තෙයා තෙයා තෙයා**

| | / 1 2 3 | / 1 2 3 | / 1 2 3 | / 1 2 3 |
|---|---|---|---|---|
| විලම්භ | තෙ යි ත | තෙ හා - | තෙ හා - | තෙ හා - |
| මධ්‍ය | තෙයි තතෙ හා | තෙහා තෙ හා | තෙයි තතෙ හා | තෙහා තෙ හා |

## සරඹ අභ්‍යාසයේ දී නිවැරදි අංගහාර ප්‍රදර්ශනය

## ගොඩ සරඹ/ඉලංගම් සරඹ/දොඹින පද

නර්තන සම්ප්‍රදායයක් ඉගෙන ගන්නා ආධුනිකයකු තමා ඉගෙන ගන්නා සම්ප්‍රදායයට අදාළ නිවැරදි අංගහාර හඳුනා ගැනීම ඉතා වැදගත් වේ. එක් එක් නර්තන සම්ප්‍රදායයෙහි අනන්‍යතාව රඳා පවතින්නේ ඊට ආවේණික අංගහාර නිවැරදි ව භාවිත කිරීමෙනි.

උඩරට නර්තන සම්ප්‍රදායය ඉගෙන ගන්නා ආධුනිකයන් ගොඩ සරඹ ද (අත් සරඹ) පහතරට නර්තන සම්ප්‍රදායය ඉගෙන ගන්නා ආධුනිකයන් ඉලංගම් සරඹ ද, සබරගමු නර්තන සම්ප්‍රදායය ඉගෙන ගන්නා ආධුනිකයන් දොඹින පද ද අභ්‍යාස කළ යුතු බව 6 ශ්‍රේණියේ දී ඔබේ අවධානයට යොමු කර ඇත. සම්ප්‍රදාය තුනට ම පොදු මූලික ඉරියව්ව වන මණ්ඩිය නිවැරදි ව පවත්වා ගනිමින් පාද චලනවලට ප්‍රමුඛතාවක් ලබා දෙන පා සරඹ අභ්‍යාසයෙන් පසු බෙර වාදනයට අනුව විලම්බ, මධ්‍ය, ලය ප්‍රභේද දෙක ම (සමගුණ, දෙගුණ) නටනු ලබන මෙම සරඹ විශේෂය ගොඩ සරඹ/ඉලංගම් සරඹ/දොඹින පද යනුවෙන් හඳුන්වනු ලැබේ. හස්ත පාද නිවැරදි ව හසුරුවමින් නිවැරදි අංගහාර ප්‍රදර්ශනය කිරීම වැදගත් වේ.

## ක්‍රියාකාරකම සඳහා උපදෙස් :

- බෙර පදය විලම්බ, මධ්‍ය (සමගුණ, දෙගුණ) ලය දෙකට තාල තබා කියන්න. (මේ සඳහා ඉහත ප්‍රස්තාරය උපයෝගී කරගන්න.)
- නිවැරදි ඉරියවු අනුව මණ්ඩියට සිට බෙර වාදනයට අනුව සරඹ අභ්‍යාසයෙහි යෙදෙන්න.
- බෙර පදය තාල තබා කියන්න.
- ගුරුවරයා බෙරය වාදනය කරන විට බෙර පදයට අනුව තාල තබන්න.
- 3, 4 ගොඩ සරඹ/ඉලංගම් සරඹ/දොඹින පද තාලයට අනුව අභ්‍යාස කරන්න.
- දෘශ්‍යාධාර හෝ ගුරු ක්‍රියාකාරකම් හෝ නිරීක්ෂණය කරමින් නිවැරදි අංගහාර සාකච්ඡා කරන්න.
- බෙර වාදනයට අනුව නිවැරදි අංගහාර අනුගමනය කරමින් සමගුණ දෙගුණ ලයට අභ්‍යාස කරන්න.
- 3,4 සරඹවලට අදාළ කස්තිරම්/ ඉරට්ටි/කලාසම් තාල තබා කියන්න.
- අදාළ කස්තිරම්/ ඉරට්ටි/අභ්‍යාස කරන්න.

## උඩරට - ගොඩ සරඹ

### තුන් වන ගොඩ සරඹය

සරඹ නාමය : තුන් අඩිය
පදය : දොම්කිට කිට දොම්
කස්තිරම : ගත්තකු ජිත්තම් ගජිතකු ජිත්තම් තරිකිට ජිත්
තරිකිට දොම්කිට තා

| | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සමගුණ | දො | මි | කි | ට | කි | ට | දොම් | - | දො | මි | කි | ට | කි | ට | දොම් | - |
| දෙගුණ | දොම් | කිට | කිට | දොම් | දොම් | කිට | කිට | දොම් | දොම් | කිට | කිට | දොම් | දොම් | කිට | කිට | දොම් |
| කස්තිරම | ගත් | - | ත | කු | ජිත් | - | තම් | - | ග | ජි | ත | කු | ජිත් | - | තම් | - |
| | තරි | කිට | ජිත් | - | තරි | කිට | දොම් | කිට | තා | - | - | - | | | | |

### හතර වන ගොඩ සරඹය

සරඹ නාමය : සිව් අඩිය
පදය : දොම් කිට කිට දොම්
කස්තිරම : ගත්තකු ජිත්තම් ගජිතකු ජිත්තම් ගජිං ජිංත කුද
ගජිතකු ජිත්තම් තරිකිට ජිත් තරිකිට දොම්කිට තා

| | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කස්තිරම | ගත් | - | ත | කු | ජිත් | - | තම් | - | ග | ජි | ත | කු | ජිත් | - | තම් | - |
| | ග | ජිං | - | ජිං | - | ත | කු | ද | ග | ජි | ත | කු | ජිත් | - | තම් | - |
| | තරි | කිට | ජිත් | - | තරි | කිට | දොම් | කිට | තා | - | | | | | | |

## පහතරට - ඉලංගම් සරඹ

**තුන් වන සරඹය : ගුංද ගුදං ගත් දිං ගත් දැහිම් (දිගගත)**

ඉරට්ටිය : දොංත ගතං ගුම් දිංගත ගත්තත්

ගද්දිත ගතගත් දිම්ගත ගුංදත් තා

| | /<br>1 2 3 4 | /<br>1 2 3 4 | /<br>1 2 3 4 | /<br>1 2 3 4 |
|---|---|---|---|---|
| සමගුණ | ගුම් - ද ගු | දම් - ගත් - | දිම් - ගත් - | දැහිම් - දිතග ගත |
| දෙගුණ | ගුම් දගු දම් ගත් | දිම් ගත් දහිම් දිගගත | ගුම් දගු දං ගත් | දිම් ගත් දහිම් දිතගත |
| ඉරට්ටිය | දොං තක තං දොං තා | දිං ගත ගත් තත් | ගත් දිත ගත ගත් | දිම් ගත ගුං දත් |

**හතරවන සරඹය : රෙගුඳ ගතකු දොම්**

ඉරට්ටිය : රෙගුඳ ගදිත ගත ගුදිතක රෙගතකු දොම්

| | /<br>1 2 3 4 | /<br>1 2 3 4 | /<br>1 2 3 4 | /<br>1 2 3 4 |
|---|---|---|---|---|
| සමගුණ | රෙ ගු ඳ ග | ත කු දොම් - | රෙ ගු ඳ ග | ත කු දොම් - |
| දෙගුණ | රෙගු ඳග තකු දොම් | රෙගු ඳග තකු දොම් | රෙගු ඳග තකු දොම් | රෙගු ඳග තකු දොම් |
| ඉරට්ටිය | රෙ ගු ඳ ග දොම් | දි ත ග ත | ගු දි ත ක | රෙ ග ත කු |

**සබරගමු - දොඹින පද**

**තුන් වන පදය : තෙයි තෙයි තෙයිත තෙයා තෙයා තෙයිත**

| | /<br>1 2 3 4 | /<br>1 2 3 4 | /<br>1 2 3 4 | /<br>1 2 3 4 |
|---|---|---|---|---|
| සමගුණ | තෙ යි තෙ යි | තෙ යි ත - | තෙ යා තෙ යා | තෙ යි ත - |
| දෙගුණ | තෙයි තෙයි තෙයි ත | තෙයා තෙයා තෙයි ත | තෙයි තෙයි තෙයි ත | තෙයා තෙයා තෙයි ත |

හතර වන පදය : තෙයි ගතකුඳ තෙයි තකට//
තෙයි ගත කුඳ // තෙයි තකට

| | / 1 2 3 4 | / 1 2 3 | / 1 2 3 | / 1 2 3 |
|---|---|---|---|---|
| සමගුණ | තෙ යි ග<br>තෙ යි ග<br>තෙ යි ග<br>තෙ යි ග | ත කු ඳ<br>ත කු ඳ<br>ත කු ඳ<br>ත කු ඳ | තෙ යි -<br>තෙ යි -<br>තෙ යි ග<br>තෙ යි - | ත ක ට<br>ත ක ට<br>ත කු ඳ<br>ත ක ට |
| දෙගුණ | තෙයි ගත කුඳ<br>තෙයි ගත කුඳ | තෙයි ත කට<br>තෙයි ගත කුඳ | තෙයි ගත කඳ<br>තෙයි ගත කුඳ | තෙයි ත කට<br>තෙයි ත කට |

## සාම්ප්‍රදායික නර්තන ඇසුරින් අලංකාර මාත්‍රා නිර්මාණය

### මාත්‍රා 2 + 3 (සුළු මැදුම්) දෙතිතට අලංකාර පද (මාත්‍රා) නිර්මාණය කිරීම.

6 ශ්‍රේණියේ දී උගත් අලංකාර පද නර්තනය පිළිබඳ අවධානය යොමු කරමින් සුළු මැදුම් (2 + 3) දෙතතිට අයත් නර්තන අංගයක් නරඹා එහි දක්නට ලැබෙන චලන, අංගහාර, තාල පිළිබඳ ව සාමූහික ව සාකච්ඡා කිරීම මෙහි දී වැදගත් වේ. ගුරුවරයා වාදනය කරන බෙර පදයට අනුව තාල තැබීමෙන් එහි රිද්මය පිළිබඳ අවබෝධය ලබා ගත හැකි ය.

මීට ඉහත අභ්‍යාස කරන ලද සරඹ ඇසුරු කරගනිමින් අලංකාර පද නිර්මාණය කර ගැනීමට උත්සාහ කරන්න. මෙහි දී උඩ පැනීම, කැරකීම, පැත්තට ගමන් කිරීම වැනි ක්‍රියාකාරකම් උපයෝගී කර ගත හැකි ය.

## වන්නම් ගයමින් නැටීම

### උඩරට - හනුමා වන්නම

6 ශ්‍රේණියේ දී ඉගෙන ගන්නා ලද හනුමා වන්නම ගායනය කරමින් බෙර වාදනයට අනුව නර්තනය කරන්න.

අලංකාර පද නැටීමෙන් පසුව කස්තිරම නර්තනය කරන්න.

කස්තිරම - රුංතක ජිංතක තරිකිට කුන්දත්
තාග්ග ජිංතක තරිකිට කුන්දත්
රුංතක ජිංතක තරිකිට කුන්දත් තා

ඉහත පරිදි කස්තිරම නර්තනය කළ හැකි අතර එම කස්තිරම පහත සඳහන් ආකාරයට දීර්ඝ ලෙස ද නර්තනය කිරීමට හැකියාව ඇත. මෙහි දී අවශ්‍ය නම් ගුරුවරයාගෙන් උපදෙස් ලබා ගන්න.

කස්තිරම - රුංතක ජිංතක තරිකිට කුන්දත්///
තාග්ග ජිංතක තරිකිට කුන්දත්//
රුංතක ජිංතක තරිකිට කුන්දත් තා

සීරුමාරුව - තකු තක ජිජි කුඳ ගජිත ගජිත කුද
ගජි ගත කුඳ කුඳ තා කුජිත්ත ගත
දොම් කිට තරිකිට කුන්දත් තා

අඩව්ව - තත් තොග තක තොග
තක්කඩ තරිකිට තකතොග
තකට ජිකට තොග ජික්කඩ තරිකිට තක තොග
තාකු ජිත්ත ගත දොම්කිට තරිකිට කුන්දත් තා

මෙම අඩව්වට අමතර ව මාත්‍රා 2 + 2 තනි තිතට අදාළ වෙනත් අඩව්වක් වුව ද යොදා ගත හැකි ය.

සීරුමාරුව සහ අඩව්ව තාල තබමින් කීමෙන් පසු ව කොටස් වශයෙන් පිළිවෙළින් නර්තනය කරන්න.

## පහතරට – හනුමන්තා තාලය සින්දු වන්නම

6 ශ්‍රේණියේ දී ඉගෙන ගන්නා ලද සින්දු වන්නම ගායනය කරමින් නැවත වන්නමේ සියලු ම කොටස් අභ්‍යාස කරන්න. එහි දී අංගහාර හා මණ්ඩිය පිළිබඳ ව සැලකිලිමත් වීම වැදගත් ය.

ඉරට්ටිය : ගතිකිට ගත දොං ගුගුඳ තරි
තත් දිත් තොං නං
ගුහිතිගදිරිකිට ගත්තත් දොම්තක දිකුදං
ගත්ත දිත්ත ගත ගහිතිගතං
තකු දිගු දොම්

## සබරගමු – අනිලා වන්නම

6 ශ්‍රේණියේ දී ඉගෙන ගන්නා ලද අනිලා වන්නම මාත්‍රා 2 + 2 තාලයට ගායනය කරමින් නර්තනය කරන්න. පසු ව කලාසම නර්තනය ද එලෙස කළ හැකි ය.

කලාසම - ජිම්කිට කිටිතක තරිකිට කිටිතක///
ගතිත කුදිත්තත්

අඩව්ව - ගත්ත කුඳත් තා දොංගඩ තරිකිට පිත් තා
ගත කුඳ පිත කුඳ තත්කඩ පිත්කඩ දොංගොඩ තරිකිට
ජෙංත ජෙංත ගත ගති ගත දිරිකිට තරිකිට තා
ජිමිත් තත් ගති ගත හර්ජිත් ගත කුඳ තා

අඩව්ව තාල තබා කීමෙන් පසු ව ගුරු උපදෙස්වලට අනුව කොටස් වශයෙන් ගෙන නර්තනය කරන්න.

## උඩරට - තුරඟා වන්නම

තිත : මාත්‍රා 2/3 දෙතිත (සුළු මැදුම්)
^ /
තාල රූපය : 1 2 1 2 3

බෙර පදය : දොං ජිංත ගත දොංත

තානම : තත් තත් තනත් තනෙන තත් තත් තනත් තනෙන
තත් තත් තනත් තම්ද නා නා
තන තනෙන තන තනෙන තතන නම් දන තනෙන
තානත් තනත් තම් ද නා නා

කවිය :

සත් වෙත් මහත් අදර ලත් යුත් සිදත් කුමරු
ගත් සිත් තොසත් පැවිදි අංගා
අණ කරන ඡන්නයෙන කන්ථකය අසු ගෙනෙන
ගෙන යෙදුණ අසුගෙ පිට නැංගා

ගත් ගත් පයත් අසුගෙ ශබ්දත් වසත් සුරිඳු
යන්නෙන් තොසින් තිදෙන සමඟ
යන යනෙන කල තිදෙන එතැන තැන පසුව දන
ගංතෙරට පත් උණිය එමඟා

ලත් ලත් සිතත් තිදෙන වෙත් වෙත් එකක් පසුව
මුත් කන්ථකත් වේ ය තුරඟා
සිදුහතුන ගෙන වහන ඡන්න වලිගය අතින
පැන්නෙන් එතෙර අනොම ගංගා

ගොත් සිත් මහත් රුසිරු ලත් යුත් සිදත් කුමරු
ගෙන් සෙත් රැගත් නෙර්ත අංගා
තිදෙන පැන ගිය ගඟින එතෙද අණ ගෙන බැතින
යෙදුව නැණ වර්ණයෙන තුරඟා

කස්තිරම : කුඳ ගජිත කුඳ ගජිත කුඳ ගජිත කුඳ තා//
(දකුණ සහ වම)
කුඳ ගජිත කුඳ තා//
කුඳ තා//
කුඳ ගජිත කුඳ ගජිත කුඳ ගජිත කුඳ තා

## පහතරට - භවාදි තාලය සින්දු වන්නම

මාත්‍රා 2 + 3 හෙවත් සුළු මැදුම් දෙතිතට බෙර පදය තාල තබමින් කියන්න. පසු ව වන්නමේ තානම, කවිය ද ගායනය කළ හැකි අතර බෙර වාදනය ද යොදා ගත හැකි ය.

සින්දු වන්නම් නර්තනයේ දී තානමටත් කවියටත් යන කොටස් දෙකට ම අලංකාර මාත්‍රා නර්තනය කිරීම විශේෂයකි. එහි දී පහතරට සරල අලංකාර පද යොදා ගත හැකි අතර සිසු ශක්‍යතා අනුව පද නර්තනය විවිධ විය හැකි ය. නියමිත අංගහාර අනුගමනය කරමින් වන්නමේ පද කොටස් නර්තන කිරීම වැදගත් වන අතර, අවසානයේ ඉරට්ටිය නැටීම සිදු කෙරේ.

### පහතරට භාවාදි තාලය සිංදු වන්නම

තිත : මාත්‍රා 2 + 3 දෙතිත (සුළු මැදුම් දෙතිත)

තාල රූපය : ^ /
1 2 / 1 2 3

බෙර පදය : දිං ගදිගතං දොංත

තානම : තෙම් තෙන තෙනම් තෙනෙන
තෙම් තෙන තෙනම් තෙනෙන
තෙම් තෙන තෙනම් තෙනෙන
තෙනෙනා

කවිය : සැමට ම බයන්කාර වෙමි නිඳු එවන් මුහුල
බලයෙන් යුදට පිවිස එදි නේ
නමකල විකුන් නැර පළ කළ රොසින් නේක
කුලවර සවන් සහස නදි නේ
දුටු දුටු බිගුන් සේම බිඳ හැර ඔවුන් සැම
සේකර කරන් සුරිඳු සර නේ
පෙමකර සිතින් බෝම නම කර කියන් ලෝක
සත රැක දෙවන් ඉසුරු නිති නේ

**ඉරට්ටිය :**

| | | |
|---|---|---|
| දිං ගතිග තම් දොංත | - | ගත ගහිති ගතම් තත් තත් |
| ගුද ගති ගතම් දොම්ත | - | ගත ගහිති ගතම් දොම් දොම් |

නියමිත තිතට ඉරට්ටිය තාල තබමින් කියන්න. පසු ව කොටස් වශයෙන් ගෙන නර්තනය කළ හැකි ය.

## සබරගමු - කුදිරාඩි වන්නම

1. ජිං ජිමිත තත් තකට යන දවුල් පදය මාත්‍රා 2 + 3 දෙතිතට තාල තබමින් කියන්න.

2. දවුල් වාදනයට අනුව තානම, කවිය කීපවරක් ගායනය කරන්න.

තානමට සහ කවි පදවලට හස්ත පාද චලනය කරමින් අලංකාර පද නැටීම සබරගමු වන්නම්වල දකිය හැකි සුවිශේෂ ලක්ෂණයකි. ඒ සඳහා මාත්‍රා පහේ අලංකාර පද හා පිට මාත්‍රා පද ආදිය යොදා ගත හැකි ය එහි දී අපට අවශ්‍ය ආකාරයට අලංකාර පද සැලසුම් කර ගත හැකි ය. වන්නමේ පද කොටස් නටා අවසානයේ කලාසම හා අඩව්ව නර්තනය කරනු ලැබේ.

## සබරගමු - කුදිරාඩි වන්නම

තිත : මාත්‍රා 2 + 3 දෙතිත (සුළු මැදුම් දෙතිත)

තාල රූපය :
^ /
1 2 / 1 2 3

දවුල් පදය : ජිං ජිමිත තත් තකට

තානම :
තත් තත්ත නත් තනෙන - තත් තත් ත නත් තනෙන
තත් තත්ත නත් තම්ද - නා නා
තන තනෙන තන තනෙන තන තනෙන තන තම්ද
තත් තත්ත නත් තම්ද නා නා

කවිය :
සත්තෙන් රජුන් පොරණ ගත්තෙන් රැගුම් කරන
ඇත්තෙන් කිවින් පිරිව රා
ඉඳ දෙපස වැඳ එකල අවසරය ගෙන එසඳ
කියත් කවි දන එතන වා ඩී
රොත්තෙන් මහත් සෙනග සිත් මෙත් බැලුම් කරන
ඇත්තෙන් කවින් පිරිව රා
එසඳ සත සිරිවයන ලෙසට යස කීම නෙක
පැවසූ සොඳ ලෙසින් බැලුණා ඩී
ගත්තෙන් රබන් ඩැක්කි කවි තාල මිහිඟු බෙර

එක්තැන් වෙමින් පැද  රා
රැගෙන මඟ යන අසුන් විලස දුන කීම කවි
එතන සිට පැවති රඟ නා  ඩී
ඇත්තෙන් කියන් මෙකවි සත්තෙන් අසන් මෙතන
නැත්නම් එයින් වෙයි පරා
දෙව ගමට දුව යන්න කියමි මේ වන්නමේ
නම අසව් මෙලෙස කුදිරා  ඩී

කලාසම : ජිං ගතත් ගත්තා ///
ජිං ගතත් ගත් තකට ජිං ගතත් ගත්තා

නියමිත තිතට කලාසම තාල තබමින් කියන්න. පසුව කොටස් වශයෙන් නර්තනය කර බෙර වාදනය සමඟ කලාසම නැවත නර්තනය කරන්න.

## ප්‍රස්තාර කිරීම

### දෙතිතේ ප්‍රභේද හඳුනා ගැනීම.

මාත්‍රා 2, මාත්‍රා 3, මාත්‍රා 4, (සුළු, මැදුම්, මහ) යන මූලික තිත් රූප තුන ආශ්‍රයෙන් දෙතිතේ තිත් රූප බෙදී යන ආකාරය පහත දක්වා ඇත.

දෙතිතේ ප්‍රභේද

| සුළු මැදුම් දෙතිත | සුළු මහ දෙතිත | මැදුම් මහ දෙතිත |
|---|---|---|
| මාත්‍රා 2 + 3 | මාත්‍රා 2 + 4 | මාත්‍රා 3 + 4 |

දෙතිතේ ප්‍රභේද ප්‍රස්තාර කිරීමේ දී තනිතිතේ ප්‍රස්තාරකරණයේ දී භාවිත කරන ලද තෙයි යන තාල සංඥාවට තිත් යන තාල සංඥාව මුලට එකතු කර තිත් තෙයි යනුවෙන් යොදා ගනු ලබයි. පහත දැක්වෙන්නේ එම සංඥා සලකුණු යොදන ආකාරය යි.

උදා :

| ^ | / | ^ | / |
|---|---|---|---|
| 1 2 | 1 2 3 | 1 2 | 1 2 3 |

### බෙරපද ප්‍රස්තාර කිරීම

**2 + 3 දෙතිතේ තාල රූපය**

| | ^<br>1 2 | /<br>1 2 3 | ^<br>1 2 | /<br>1 2 3 |
|---|---|---|---|---|
| උඩරට | දොං - | ජිං - ත | ග ත | දොං - ත |
| පහතරට | ගං - | දෙ ග ත | ගත් - | ත ගං - |
| සබරගමු | ජිං - | ජි මි ත | තත් - | ත ක ට |

## 2 + 4 තාල රූපය

| | ^ | | / | | | | ^ | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 1 | 2 | 3 | 4 |
| උඩරට | දොං | - | දොං | - | ජිං | - | ජිං | - | ග | ජි | ග | ත |
| පහතරට | දොං | - | දොං | - | ග | ත | ගත් | - | දිත් | - | ත | කු |
| සබරගමු | ජිං | - | ජි | මි | කි | ට | තත් | - | ත | රි | කි | ට |

## 3 + 4 තාල රූපය

| | ^ | | | / | | | | ^ | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| උඩරට | දෝං | - | - | ජිං | - | ජිං | - | ත | ක | ට | දොං | - | ත | ක |
| | ත | කුං | - | ජිං | - | ජිං | - | ත | ක | ට | දොං | - | ත | ක |
| පහතරට | ගුං | - | ද | ග | ති | ග | ත | ගත් | - | ත | ගු | දි | ගු | ද |
| සබරගමු | ජි | මිත් | - | තක් | - | කි | ට | ත | ක | ට | ජිං | - | ත | ක |

# කවි ප්‍රස්තාර කිරීම

## තාලම් කවි

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| අ | ගේ | - | ව | ඩ | න | ම | ගෙ | තා | - | ළම් | - |
| හ | ර | ඹ | බ | ලන් | - | නේ | - | - | - | - | - |
| ව | ගේ | - | නො | දූ | න | ඇ | යි | නූ | ඔ | ලා | - |
| කී | - | ම | ට | එන් | - | නේ | - | - | - | - | - |
| ක | ගේ | - | ගිල් | - | ල | ලෙ | ස | බැ | රි | වෙයි | - |
| නු | ඹ | ට | බො | ලන් | - | නේ | - | - | - | - | - |
| ම | ගේ | - | දැ | - | ත | තා | - | ල | මි | ප | ට |
| හ | ර | ඹ | බ | ලන් | - | නේ | - | - | - | - | - |

## කුළු කවි

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| ළ | මා | - | ලි | යෝ | - | ග | ව | සා | - | මල් | - |
| ව | ර | ළ | පි | ට | - | - | - | - | - | - | - |
| ද | මා | - | ක | ර | ට | මු | තු | පො | ට | අ | ත |
| ව | ළ | ලු | ව | ට | - | - | - | - | - | - | - |
| පෙ | මා | - | ව | ඩ | න | ලෙ | ස | ස | ර | සා | - |
| ඔ | ස | රි | පො | ට | - | - | - | - | - | - | - |
| ප | මා | - | නො | ව | ර | ග | ති | කු | ලු | ගෙ | න |
| ස | බේ | - | පි | ට | - | - | - | - | - | - | - |

## මල් යහන් කවි

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| පු | ටු | ව | ස | ර | ස | ලැයි | - | ම | ම | සෑ | ල |
| ක | රන් | - | නේ | - | - | - | - | - | - | - | - |
| පු | ටු | වෙ | ති | යෙ | න | ද | ඵ | බු | ල | තුයි | - |
| පු | දන් | - | නේ | - | - | - | - | - | - | - | - |
| කැ | ටු | ව | සිව් | - | ව | රන් | - | ස | ම | ගින් | - |
| බ | ලන් | - | නේ | - | - | - | - | - | - | - | - |
| ශ්‍රි | යා | - | දේ | - | වි | මල් | - | අ | ස් | නෙ | ට |
| ව | ඩින් | - | නේ | - | - | - | - | - | - | - | - |

# වන්නම් ප්‍රස්තාර කිරීම

## උඩරට - තුරඟා වන්නම

### තාල රූපය : මාත්‍රා 2 + 3 සුළු මැදුම් දෙතිත

| | ^ | | / | | | ^ | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 3 | |
| බෙර පදය | දොං | - | ජිං | - | ත | ග | ත | දොං | - | ත | |
| තානම | තත් | - | තත් | - | ත | නත් | - | ත | නෙ | න | |
| | තත් | - | තත් | - | ත | නත් | - | ත | නෙ | න | |
| | තත් | - | තත් | - | ත | නත් | - | තම් | - | ද | |
| | නා | - | නා | - | - | - | - | - | - | - | |
| | ත | න | ත | නෙ | න | ත | න | ත | නෙ | න | |
| | ත | ත | න | තම් | - | ද | න | ත | නෙ | න | |
| | තා | - | නත් | - | ත | නත් | - | තම් | ද | - | |
| | නා | - | නා | - | - | - | - | - | - | - | |
| කවිය | සත් | - | වෙත් | - | ම | හත් | - | අ | ද | ර | |
| | ලැත් | - | යුත් | - | සි | දුත් | - | කු | ම | රු | |
| | ගත් | - | සිත් | - | තො | සත් | - | පැ | වි | දි | |
| | අං | - | ගා | - | - | - | - | - | - | - | |
| | අ | ණ | ක | ර | න | ජන් | - | න | යෙ | න | |
| | කන් | - | ථ | ක | ය | අ | සු | ගෙ | නෙ | න | |
| | ගෙ | න | ඵ | දු | න | අ | සු | ගෙ | පි | ට | |
| | නෑං | - | ගා | - | - | - | - | - | - | - | |
| කස්තිරම | කු | ඳ | ග | ජී | ත | කු | ඳ | ග | ජී | ත | } // |
| | කු | ඳ | ග | ජී | ත | කු | ඳ | තා | - | | } |
| | කු | ඳ | ග | ජී | ත | කු | ඳ | තා | - | | // |
| | කු | ඳ | තා | - | | කු | ඳ | තා | | | |
| | කු | ඳ | ග | ජී | ත | කු | ඳ | ග | ජී | ත | |
| | කු | ඳ | ග | ජී | ත | කු | ඳ | තා | | | |

## භාවාදි තාලය සින්දු වන්නම

### මාත්‍රා 2 + 3 දෙතිත (සුළු මැදුම් දෙතිත)

| | ^ | | / | | | ^ | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 3 |
| බෙර පදය | දිං | - | ග | ති | ග | තම් | - | දොං | - | ත |
| තානම | තෙම් | - | තෙ | න | තෙ | නම් | - | තෙ | නෙ | න |
| | තෙම් | - | තෙ | න | තෙ | නම් | - | තෙ | නෙ | න |
| | තෙම් | - | තෙ | න | තෙ | නම් | - | තෙ | නෙ | න |
| | තෙ | නෙ | නා | - | - | - | - | - | - | - |
| කවිය | සැ | ම | ට | ම | බ | යන් | - | කා | - | ර |
| | වෙ | මි | නි | ඳු | එ | වන් | - | මු | හු | ල |
| | බ | ල | යෙන් | - | යු | ද | ට | පි | වි | ස |
| | එ | දි | නේ | - | - | - | - | - | - | - |
| | න | ම | ක | ල | වි | කුන් | - | නෑ | - | ර |
| | ප | ල | ව | ර | ස | සිත් | - | නේ | - | ක |
| | කු | ල | නේ | - | - | වන් | - | ස | හ | ස |
| | න | දි | ඳු | ටු | බි | - | - | - | - | - |
| | දා | ම | හැ | ර | ෂ | ගුන් | - | සේ | - | - |
| | ඕ | ඳ | ක | ර | න | වූන් | - | සෑ | - | ම |
| | සේ | - | නේ | - | - | රන් | - | සු | රි | ඳු |
| | ස | ර | ක | ර | යි | - | - | - | - | - |
| | පෙ | ම | ක | ර | කි | තිත් | - | බෝ | - | ම |
| | න | ම | රු | ක | දෙ | යන් | - | ලෝ | - | ක |
| | ස | ත | නේ | - | - | වන් | - | ඉ | සු | රු |
| | නි | ස | | | | - | - | - | - | - |
| ඉරට්ටිය | දිං | - | ග | ති | ග | තං | - | දොං | - | ත |
| | ග | ත | ගහතිග | තම් | - | තත් | - | තත් | - | - |
| | ගු | ඳ | ග | ති | ග | තං | - | දොං | - | ත |
| | ඟ | ත | ගහිතිග | තං | - | දොං | - | දොං | | |

# කුදිරඩි වන්නම (සබරගමු)

| | ^ | | / | | | ^ | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 3 |
| දවුල පදය | ජීං | - | ජී | මි | ත | තත් | - | ත | ක | ට |
| තානම | තත් | - | තත් | - | ත | නත් | - | ත | නෙ | න |
| | තත් | - | තත් | - | ත | නත් | - | ත | නෙ | න |
| | තත් | - | තත් | - | ත | නත් | - | ත | මි | ද |
| | නා | - | නා | - | - | - | - | - | - | - |
| | ත | න | ත | නෙ | න | ත | න | ත | නෙ | න |
| | ත | න | ත | නෙ | න | ත | න | තම් | - | ද |
| | තත් | - | තත් | - | ත | නත් | - | ත | මි | ද |
| | නා | - | නා | - | - | - | - | - | - | - |
| කවිය | සත් | - | තෙන් | - | ර | ජුන් | - | පො | ර | ඤ |
| | ගත් | - | තෙන් | - | ඍ | ගුම් | - | ක | ර | න |
| | ඇත් | - | තෙන් | - | කි | වින් | - | පි | රි |ව |
| | රා | - | - | - | - | - | - | - | - | - |
| | ඉ | ඳ | දෙ | ප | ස | වැ | ඳ | එ | ක | ල |
| | අ | ව | ස | ර | ය | ගෙ | න | එ | ස | ඳ |
| | කි | යත් | - | ක | වි | දෑ | න | එ | තැ | න |
| | වා | - | ඩී | - | - | - | - | - | - | - |
| | රොත් | - | තෙන් | - | ම | හත් | - | සෙ | න | ග |
| | සිත් | - | මෙන් | - | බැ | ලූන් | - | ක | ර | න |
| | ඇත් | - | තෙන් | - | ක | වින් | - | පි | රි | ව |
| | රා | - | - | - | - | - | - | - | - | - |
| | එ | ස | ද | ස | ත | සි | රි | ව | ය | න |
| | ලෙ | ස | ට | ය | ස | කි | - | ම | නෙ | ක |
| | පැ | ව | සූ | සො | ඳ | ලෙ | සින් | - | බැ | ලූ |
| | ඤා | - | ඩී | - | - | - | - | - | - | - |
| | ගත් | | තෙන් | - | ර | බන් | - | ඩැක් | - | කි |
| | ක | වි | තා | - | ල | මි | හි | ගු | බෙ | ර |
| | එ | එක් | තැන් | - | වෙ | මින් | - | පෑ | - | ද |
| | රා | - | - | - | - | - | - | - | - | - |
| | ඍ | ගෙ | න | ම | ග | ය | හ | අ | සූන් | - |
| | වි | ල | ස | දෑ | න | කී | - | ම | ක | වි |
| | එ | ත | න | සි | ට | පැ | ව | ති | ර | ග |
| | නා | - | ඩී | - | - | - | - | - | - | - |
| | ඇත් | - | තෙන් | - | කි | ය | න | මෙ | ක | වි |
| | සත් | - | තෙන් | - | අ | සන් | - | මෙ | ත | න |
| | නැත් | - | ත | මි | එ | ඉන් | - | වෙ | යි | ප |
| | රා | - | | | | | | | | |
| කලාසම | ජීං | - | ග | තත් | - | ගත් | - | තා | - | - |
| | ජීං | - | ග | තත් | - | ගත් | - | තා | - | - |
| | ජීං | - | ග | තත් | - | ගත් | - | ත | ක | ට |
| | ජීං | - | ග | තත් | - | ගත් | - | තා | | |

# 3 පරිච්ඡේදය

## 3.0 සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ

### සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ

### දවුල වාද්‍ය භාණ්ඩය

සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ ලෙස හඳුන්වනු ලබන ගැට බෙරය, දෙවොල් බෙරය, දවුල, තම්මැට්ටම, උඩැක්කිය, රබාන සහ තාලම්පට උඩරට, පහතරට, සබරගමු යන සම්ප්‍රදායන්ට ආවේණික වූ භාණ්ඩ ය. ඉහත සඳහන් කළ භාණ්ඩ අතරින් සබරගමු නර්තන සම්ප්‍රදායයේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වන දවුල, වාද්‍ය භාණ්ඩ අතර දීර්ඝ ඉතිහාසයක් ඇත.

පුරාණයේ සිට ආගමික අවස්ථාවල තේවා හේවිසි වාදන, පෙරහැර සඳහා මෙන් ම සන්නිවේදන කාර්යයට ද දවුල භාවිත කර ඇත. උදාහරණ ලෙස : හේවිසි, අණ බෙර, මළ බෙර, රණ බෙර දැක්විය හැකි ය. මේ සැම අවස්ථාවක ම දවුල් වාදනය ප්‍රධාන වන අතර සමහර අවස්ථාවල තම්මැට්ටම හා හොරණෑව සහාය වාද්‍ය භාණ්ඩ ලෙස යොදාගෙන ඇත.

දඹදෙණි අස්නෙහි ''ලෝහ දවුල්, ජින දවුල්, මහ දවුල් ........ වශයෙන් දවුල් වර්ග කීපයක් නම් කර ඇත. ලංකාවේ ඉපැරණි ජන කොටසක් වන වැදි ජනයා අතර පවතින්නේ ද දවුලට සමාන වූ සිලින්ඩරාකාර බෙරයකි.



සබරගමු නර්තන සම්ප්‍රදායය සඳහා යොදා ගන්නා දවුලට සමාන බෙර වර්ග ආසියාවේ වෙනත් රටවල ද බෙහෙවින් දකිය හැකි වේ. කෙසේ වෙතත් දවුල අපට ආවේණික සංස්කෘතියට අනුව සකස් කරගෙන සාදා ඇත. දවුල සෑදීමට මූලික ව ගස කැපීම ද ශුභ මුහූර්තයෙන් කරන ආකාරය පහත සඳහන් කවියෙන් විස්තර වේ.

ඇසළය පසළොස්වක          දා
මිල්ලය පේ කරපු එ          දා
නියමින් සුබ මොහොත එ          දා
දවුලට කඳ කැපුව එ          දා

මේ ආකාරයට සුබ මොහොතින් ඇහැළ, කොහොඹ, කොස්, මිල්ල කිතුල් ආදි ගසක, වට ප්‍රමාණය අඟල් 45 ක්වන කඳක්, දිගින් අඟල් 15ක ප්‍රමාණයට ගෙන සකස් කර ගැනේ. ඒ පිළිබඳ දවුල් උපතේ සඳහන් වන්නේ පහත ආකාරයට ය.

කඳ දිග පසළොස් අඟු          ලේ
වට හතළිස් පස් අඟු          ලේ
ඒ දැක රුසි නියම ක          ළේ
මේ ලෙස නියමයි දවු          ලේ

මේ අයුරින් සකස් කර ගන්නා දවුල් කඳට යොදන ඇස සකස් කර ගන්නේ හරක් හම් හෝ එළු හම් හෝ භාවිත කරමිනි. එළු හම හෝ හරක් හම පැය 2, 3ක කාලයක් ජලයෙහි පොඟවයි. එම සම මෘදු තත්ත්වයට පත් කර ගෙන, හොඳින් ඇද බෙර කඳෙහි ඇති කුහරය වැසෙන සේ තබා ප්‍රමිතියට අනුව අවශ්‍ය ආකාරයට බැඳ දවුල සකස් කර ගනී.

මෙසේ සකස් කර ගන්නා දවුල අන් වාද්‍ය භාණ්ඩවලට වඩා විශේෂත්වයක් දක්වන තවත් හේතුවකි, එක් පැත්තක් අතින් සහ අනික් පැත්ත උපකරණයක් භාවිත කරමින් වාදනය කිරීම. අනෙක් සියලු ම භාණ්ඩ වාදනයට ශිල්පීන් යොදා ගන්නේ තම දෑත් පමණි. නැතහොත් උපකරණ පමණි. දවුල වාදනයට යොදා ගන්නා උපකරණය හඳුන්වන්නේ කඩිප්පුව නමිනි. එබැවින් පංච තූර්ය වර්ගීකරණයේ ''විතතාතත'' වර්ගයට දවුල අයත් වේ. කඩිප්පුව සෑදීම සඳහා 'ඇට්ටේරියා' වැනි ගස්වල කෝටු උපයෝගී කර ගැනේ. කඩිප්පුවේ රූප සටහනක් පහත දැක්වේ.



ඉහත ආකාරයට සදා ගන්නා කඩිප්පුව අල්ලන කොටස සඳහා රෙදි පටි ඔතන්නේ වාදනය කිරීමේ දී ලිස්සීම වළක්වා ගැනීමට ය.

## ක්‍රියාකාරකම

1. පුරාණයේ දවුල භාවිත කර ඇති වාදන අවස්ථා හතරක් නම් කරන්න.
2. දවුල් ඇස සෑදීමට ගන්නා සම් වර්ග දෙක නම් කරන්න.
3. දවුල වාදනය සඳහා භාවිත කරන උපකරණයේ නම කුමක් ද?
4. දවුලේ දිග ප්‍රමාණය සහ දවුල් කඳෙහි වට ප්‍රමාණය ලියන්න.

## විකල්ප වාද්‍ය උපකරණ

විකල්ප වාද්‍ය උපකරණ ලෙස හඳුන්වනු ලබන්නේ ඉවත ලන ද්‍රව්‍ය උපයෝගී කර ගෙන සුළං මඟින්, දෑත් හා උපකරණ ආදි දේ යොදා ගෙන තට්ටු කිරීමෙන් හෝ තෙරපීමෙන් හෝ හඬ උපදවා ගැනීමට හැකි ආකාරයට නිපදවා ගත් භාණ්ඩ යි.

හය ශ්‍රේණියේ දී ටින් බෙර, එක්ස්රේ බෙර, ගස්ලබු බට නළා ආදිය සකස් කළ බව මතක ඇති.

ඒ ආකාරයට සෑදූ ටින් බෙර තුනක් ගෙන එක ටින් බෙරයකට වතුර 3/4 පමණ පිරවිය හැකි ය. අනෙකට වතුර 1/4 පමණ පිරවිය හැකි ය. අනෙකට කුඩා ගල් කැට 2/4 ක් පමණ පිරවිය හැකි ය.



වාදනය සඳහා කෝටු කැලි දෙකක් භාවිතයට ගත හැකි ය.

එසේ ම ගොයම් නැටුමේ දී භාවිත කරන බුම්මැඩියට සමාන උපකරණයක් සාදා ගත හැකි ය. මැටි/පිත්තල කළයක් සහ එක්ස්රේ කොළයක් ගෙන කළයේ කට වැසෙන සේ එක්ස්රේ කොළය තබා කට ගැට ගසන්න. එයට තට්ටු කිරීමෙන් ද හඬ උපදවා ගත හැකි ය.

තව ද කට නොවසන ලද වීදුරු බෝතල කීපයක් සහ රුපියලේ/ශත පනහේ හෝ කාසි දෙකක් ගෙන එම බෝතලයට කාසිවලින් තට්ටු කිරීමෙන් හඬ උපදවා ගත හැකි ය.

මීට අමතර ව සාමාන්‍ය ප්‍රමාණයේ පොල් කටු දෙකක් ගෙන එ තුළට ලී කැබලි දෙකක් සවි කර එම ලී කැබැල්ලෙන් අල්ලා පොල් කටු දෙක එකට ගැසීමෙන් ද හඬ උපදවා ගත හැකි ය.

## ක්‍රියාකාරකම

1. සෙලවීමෙන්, තට්ටු කිරීමෙන් හා පිඹීමෙන් වාදනය කළ හැකි විකල්ප වාද්‍ය උපකරණ දෙක බැගින් නම් කරන්න.
2. නම් කරන ලද එක් භාණ්ඩයක් සකස් කර වාදනය කරන්න.

## සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ

සමූහ වාදනයක් කරමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කිරීම සඳහා සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ මෙන් ම විකල්ප වාද්‍ය උපකරණ ද උපයෝගී කර ගත හැකි ය. මේ සඳහා සාම්ප්‍රදායික භාණ්ඩ වන ගැට බෙරය, දෙවොල් බෙරය, දවුල, තම්මැට්ටම, උඩැක්කිය, රබාන ආදි වාද්‍ය භාණ්ඩ සූදානම් කර ගත හැකි ය. මේවා එක් වර්ගයකින් එක් භාණ්ඩයක් වත් තිබිය යුතු ය. එසේ ම 6 ශ්‍රේණියේ දී මෙන් ම 7 ශ්‍රේණියේ දී නිපදවා ගත් විකල්ප වාද්‍ය උපකරණ එක් වර්ගයකින් දෙක බැගින් හෝ යොදා ගත යුතු ය.

උදා : සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩයක් වන ගැටබෙරයක් හා එයට විකල්ප උපකරණයක් ලෙස සකස් කරන ලද ටින් බෙර දෙකක් ගැනීම සුදුසු ය.

මෙසේ සකස් කර ගත් භාණ්ඩවලට සහ සාම්ප්‍රදායික භාණ්ඩවලට තට්ටු කිරීමේ දී නොයෙක් ආකාරයේ ශබ්ද නිපදවෙයි. තාලයකට අනුව බෙර පදයක් වාදනය කරමු.

| | | | |
|---|---|---|---|
| /<br>1 2 | /<br>1 2 | /<br>1 2 | /<br>1 2 |
| කු ඳ | ග ත | ග ත | දොම් - |
| /<br>1 2 3 | /<br>1 2 3 | /<br>1 2 3 | /<br>1 2 3 |
| කු ඳ ට | ග ත ට | කු ඳ ට | ග ජිං - |

මෙම බෙර පදවලට අදාළ ශබ්ද ධ්වනි වාදන භාණ්ඩවලින් වාදනය කළ හැකි ය.

ඊට අමතර ව විවිධ භාණ්ඩවලට පදය කොටස් කර දීමෙන් විවිධත්වයක් ඇති කරගත හැකි ය. උදාහරණ ලෙස පහත වගුව බලන්න.

| | | | |
|---|---|---|---|
| ගැටබෙරය | විකල්ප වාද්‍ය උපකරණ තම්මැට්ටම | දවුල | ගැටබෙරය, විකල්ප වාද්‍ය උපකරණ සහ දවුල |
| කුඳට | ගතට | කුඳට | ගජිං |

මේ ආකාරයට බෙර පද වෙනුවට විකල්ප බෙර පද යොදා ගැනීම ද කළ හැකි ය.

තව ද - කුඳට ගතට කුඳට ගජිං (ඉහත වගුව ආකාරයට)
චල් චල් චල් ගජිං ගජිං (ගැටබෙරය, දවුල සහ විකල්ප වාද්‍ය උපකරණය තම්මැට්ටම)

වැලි පුරවන ලද ප්ලාස්ටික්
බෝතලය සෙලවීම

ඉහත ආකාරයට ද වාදනය ඉදිරිපත් කළ හැකි ය.

මීට අමතර ව සියලු භාණ්ඩ උපයෝගී කර ගනිමින් නොයෙකුත් ආකාරයට වාදනය කිරීම කළ හැකි ය. ඉහත සඳහන් කරන ලද්දේ තනි තිත සඳහා බෙර පදයකි. මීට අමතර ව දෙතිතට අයත් තාල රූපවලට ද වාදනය කළ හැකි ය.

උදා : දොං ජිංත ගත දොංත

මෙවැනි කවි පද නිර්මාණය කර වාදනය කිරීම ද කළ හැකි ය.

| | |
|---|---|
| මළ හිරුත් බැස | යනව |
| සුදු නංගි ගෙට | එන්න |
| බුදු සාදු බලන් | ඇති |
| මල් පහන් දල් | වමු ද |

## තේමාවකට අනුව වාදන

මීට පෙර උගත් පද ඇසුරෙන් නොයෙක් ආකාරයට පද වාදනය සිදු කළ හැකි අතර තේමාවක් අනුව වාදනය කිරීම ද කළ හැකි ය.

වටිනා සංස්කෘතික අංගයක් දෘශ්‍යමාන වන 'පෙරහැර' තේමාව ලෙස ගනිමු. පෙරහැරක් මතකයට ගන්න. එහි නාදය පිළිබඳ හඬ අවධානයට යොමු කරන්න. ඇතින් එන පෙරහැරෙහි හඬට කන් දුන් අයුරු මෙනෙහි කරන්න. ඔබට ඇසුණු මුල් ම හඬ සිට අවසන් වන තෙක් ඇසුණු හඬ නැවත ආවර්ජනය කරන්න.

පෙරහර පිළිබඳ කරුණු සාකච්ඡා කරන්න.  කස හඬ ඇසුරෙන් නම් එම හඬ උපදවන ආකාරයට විකල්ප වාද්‍ය උපකරණයක් නිර්මාණය කර (ගොප් කොළ කීපයක් දිගට ඉරා (වෙන් නොකර) ගත හැකි ය.

ඉන් පසු ව ගමේ පෙරහැරෙහි නම් පඬුරු පෙට්ටියක් සොලවමින් එන හඬ ඇසෙයි.  ඒ වෙනුවට ටොනික් පියන්වලින් සැදූ වළල්ලෙන් ප්‍රයෝජන ගත හැකි ය.

ඉන් පසු හේවිසි හඬ වෙනුවට ටින් බෙර, අයිස්ක්‍රීම් කෝප්පවලින් සැදූ තම්මැට්ටම්, ගස්ලබු බටයෙන් සැදුම්ලත් නළාව ආදිය ගැනීමට පුළුවන.

එසේ ම ගැමි නැටුම්වල දී  ලී එකට ගැසීමෙන්  ලී කෙළි තාල හඬට ද, පොල්කටු එකට ගැසීමෙන් පතුරු නැටුමේ හඬට සමාන හඬක්  උපදවා ගත හැකි ය.

මේ ආකාරයට විකල්ප වාද්‍ය භාණ්ඩ  හසුරුවා පෙරහැරක් සඳහා සමූහ වාදනයක් ඉදිරිපත් කළ හැකි ය.

# 4 පරිච්ඡේදය

## 4.0 ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනාවල පසුබිම හා ගායනය

### වන්නම්වල සමාජ සංස්කෘතික පසුබිම

උඩරට, පහතරට, සබරගමු යන නර්තන සම්ප්‍රදාය ත්‍රිත්වයට ම පොදු වූ වන්නම්, මුල් යුගයේ රචනා වී ඇත්තේ ගායනය සඳහා ය. උඩරට වන්නම් හා සබරගමු වන්නම් විනෝදාස්වාදය අරමුණු කොට ගෙන රචනා වී ඇති අතර, පහතරට සින්දු වන්නම් දෙවිනුවර උපුල්වන් (විෂ්ණු) දෙවියන් කෙරෙහි භක්තිය පෙරදැරි කොට ගෙන ශාන්තියක් අපේක්ෂාවෙන් රචනා වී ඇති බව පෙනේ. ගායන කිරීම සඳහා ම රචනා වී ඇති මෙම වන්නම්වලට පසු කාලයේ නර්තනය යොදා ගෙන ඇත. ප්‍රස්තුතයෙන් කියවෙන අදහස ප්‍රකාශ වීමක් සාම්ප්‍රදායික වන්නම් නර්තනයේ දී ඉදිරිපත් නොකිරීම පොදු ලක්ෂණයකි. ගායනයට අනුව තාලානුකූල චලනයන්හි යෙදීම වන්නම් නර්තනයේ ආවේණික ස්වභාවය යි.

උඩරට නර්තන සම්ප්‍රදායයේ වන්නම් දහ අටක් ද පහතරට සින්දු වන්නම් තිස් දෙකක් ද භාවිතයේ ඇති අතර සබරගමු සම්ප්‍රදායයේ වන්නම් (21) විසි එකක් ලෙස පිළිගෙන ඇති නමුදු දැනට වන්නම් දහ අටක් භාවිතයේ පවතී. නාමික වශයෙන් උඩරට හා සබරගමු සමහර වන්නම්වල සමානත්වයක් දක්නට ඇති අතර පහතරට සින්දු වන්නම් තාල රීතීන්ට අනුකූල ව ලියවී ඇති බව පෙනේ.

### උඩරට නර්තන සම්ප්‍රදායය - තුරඟා වන්නම

තුරඟා යනු අශ්වයාට සමානාර්ථ පදයකි. තුරඟා වන්නමේ ප්‍රස්තුතයෙන් වර්ණනා වන්නේ සිදුහත් කුමරු ගිහිගෙය අතහැර කන්තක නම් වූ අසු පිට නැඟී අනෝමා ගං තෙරින් එතෙර වී පැවිදි බව ලබා ගැනීමට පිටත් වූ ආකාරය යි.

මෙම වන්නම මාත්‍රා 2 + 3 දෙතිතේ තාල රූපය අනුව ගායනය කෙරේ. එම තාල රූපයට අනුකූල ව ගායනයේ නාදමාලාව සැකසී ඇත.

## පහතරට නර්තන සම්ප්‍රදාය - භාවාදි තාලය සින්දු වන්නම

පොදුවේ සින්දු වන්නම්වල දැකිය හැකි සෙත් ශාන්තිය පිළිබඳ ව අපේක්ෂාව භාවාදි තාලය සින්දු වන්නමෙන් පිළිබිඹු වේ. මාත්‍රා 2 + 3 තාල රූපය අනුව ගායනය කෙරෙන මෙම සින්දු වන්නම රචනා වි ඇත්තේ ද විෂ්ණු දෙවියන්ගේ ගුණ පිළිබඳ වර්ණනා කිරීම සඳහා ය. විෂ්ණු දෙවියන්ගේ වීර වික්‍රමාන්විත භාවය විස්තර කර ලෝක සත්ත්වයා ආරක්ෂා කර දෙන ලෙස නමස්කාර පූර්වක ව ඉල්ලා සිටීම මෙම කවියෙන් අදහස් වේ.

## සබරගමු නර්තන සම්ප්‍රදාය - කුදිරඩි වන්නම

මාත්‍රා 2 + 3 තාල රූප අනුව කුදිරාඩි වන්නම ගායනා කෙරේ.
**(* වන්නම් ගායනය සඳහා පිටු අංක 16 සිට ඇති වන්නම් භාවිතයට ගන්න.)**

## කුලු නැටුමේ ගායනාවල සමාජීය හා සංස්කෘතික පසුබිම

කෘෂිකාර්මික සමාජයේ අත්‍යවශ්‍ය උපකරණයක් ලෙස භාවිත වූ කුල්ල පදනම් කර ගෙන නිර්මාණය වී ඇති කවි, කුලු නැටුමේ කවි වශයෙන් හැඳින්විය හැකි ය.

කුල්ල සකස් කර ඇති ආකාරය ඒ සඳහා යොදා ගත් අමුද්‍රව්‍ය හා කුලු රැගෙන ක්‍රියාකාරකම්වල යෙදෙන කාන්තාවන් පිළිබඳ තොරතුරු මෙන් ම කුල්ල උපයෝගී කර ගෙන සිදු කෙරෙන විවිධ කාර්යයන් ගැන ද කුලු කවිවලින් කියවේ. සරල භාෂා ශෛලියක් යොදා ගනිමින් කුල්ලෙන් සිදු කෙරෙන මෙම කාර්යයන් අතිශයෝක්තියකින් තොර ව ගැමි කවියා ඉදිරිපත් කර ඇති ආකාරය එම කවි පිළිබඳ තොරතුරු විමසා බැලීමෙන් පැහැදිලි වේ. මෙහි නාද මාලාවේ සුවිශේෂත්වය වන්නේ කුල්ලෙන් කරනු ලබන ක්‍රියාකාරකම් නිරූපණය කිරීමට උචිත අයුරින් නිර්මාණය වී තිබීමයි.

උදා : රන්තෙලඹුවේ හා රත්නවල්ලියේ එන කවි ද කුලු නැටුම සඳහා භාවිතයට ගැනේ.

## තාලම් නැටුමේ කවිවල සමාජ සංස්කෘතික පසුබිම

ශ්‍රී ලංකාවේ ප්‍රචලිත ගැමි ගායනා අතර තාලම් කවි තවත් සුවිශේෂ කොටසක් ලෙස හැඳින්විය හැකි ය. නර්තන, ගායන, වාදන යන ත්‍රිත්ව ක්‍රියාවලියේ දී තාල තැබීම හෙවත් තාලය මතු කොට දැක්වීම තාලම්පටින් සිදු වේ. පහතරට, සබරගමු නර්තන සම්ප්‍රදාය දෙකට ම වඩා තාලය ඉස්මතු කොට දැක්වීම සඳහා තාලම්පට භාවිත කෙරෙන්නේ උඩරට නර්තන සම්ප්‍රදායයේ දී ය. ඒ අනුව තාලම්පොටින් සිදු කෙරෙන මෙම ක්‍රියාවලිය තව දුරටත් මතු කොට දැක්වීම සඳහා තාලම්පොට සම්බන්ධ කොට ගෙන විවිධ අදහස් දැක්වෙන කවි නිර්මාණය වී ඇති අයුරු විමසා බලමු. දැනට රචනා වී ඇති ඇතැම් තාලම් කවි විමසා බැලීමේ දී තමන්ගේ ප්‍රතිවාදීන්ට අභියෝග කරන ආකාරය, එහි ඇති සුවිශේෂත්වය බවත් සරල භාෂා ශෛලියක් යොදා ගනිමින් නිර්මාණය කර ඇති බවත් පෙනේ. මේ අනුව උඩරට නර්තන සම්ප්‍රදායයේ දී භාවිත කළ තාලම්පට ඇසුරු කර ගනිමින් තාලම් කවි නමින් කවි ගායනය නිර්මාණය වී ඇති බැව් කිව හැකි ය.

උදා : අගේ වඩන මගේ තාලම් .................... (36 පිටුව බලන්න)

## මල්යහන් කව්වල සමාජයීය හා සංස්කෘතික පසුබිම

ඕනෑ ම සමාජයක සුබ කටයුත්තක් ආරම්භයේ දෙවි දේවතාවුන්ගෙන් ආශීර්වාදය ලබා ගැනීම සිරිතකි. එනිසා ම කරදරයක්, අපල උපද්‍රවයක්, අස්වැන්නේ අඩු වැඩි වීමක් සිදු වුව ද දෙවියන්ගේ පිහිට ලබාගැනීමේ අරමුණින් බොහෝ ශාන්තිකර්ම සිදු කරන ලද අතර එහි මූලික අරමුණ වන්නේ දෙවි - දේවතාවන්ට පුදසෙත් ලබා දී පිහිට ලබා ගැනීම යි. මේ නිසා ශාන්ති කර්ම ආරම්භයේ දී ශාන්තිකර්ම රංග භූමිය ඉදිරිපසින් මල් යහනක් ඉදිකොට එම යහනට දෙවියන්ට වඩින ලෙස ආරාධනා ස්වරූපයෙන් ගායනා කරනු ලබන කාව්‍ය විශේෂය මල් යහන් කවි යනුවෙන් හැඳින්වෙයි. මේවා උඩරට, පහතරට, සබරගමු යන ත්‍රිවිධ සම්ප්‍රදායයන්හි යොදා ගැනේ. ප්‍රාදේශීය විවිධත්වය අනුව පුද ලබන දෙවියන් මුල් කොට මේවා ඉදිරිපත් කරයි. සම්ප්‍රදායයන් අනුව මෙම ගායනාවල නාදමාලාවන්ගේ වෙනසක් දැකිය හැකි ය.

උදා : මිහින්තලය අටසැටලෙන ..........................
පුටුව සරසලයි.........................

## තලමල කවි ගායනාවල සමාජීය හා සංස්කෘතික පසුබිම

ග්‍රාමීය පරිසරයේ ස්වභාව සෞන්දර්යය විදහාපාන තල ගස දීර්ඝ කාලයකට පසු එම ගසේ ආයුකාලය අවසන් වන මොහොතක තලමල පිපෙන බව ගැමි ජන සමාජය තුළ පවතින විශ්වාසය යි.

එවන් පරිසරයක සුන්දරත්වය විදහාපාන තලමලෙහි ස්වභාවය, වර්ණය, ප්‍රමාණය වැනි සුවිශේෂ ලක්ෂණ ගැමි ජනතාව අවදි කරවීමට හේතු වේ. එසේ වුව ද තලමල පිබිදීම ගමට අසුභ සංකේතයක් බව ගැමි ජන සමාජයේ විශ්වාසය යි.

එසේ හෙයින් එදා ගැමියා තලමල කපා ගමෙන් ඉවතට ගෙනයාම සඳහා එයට ගෞරව දක්වමින් හිස මත තබා ගෙන හෝ ඇතු පිට තබාගෙන හෝ රැගෙන ගිය බව කවි ගායනාවලින් මතුකර දැක්වෙයි.

## තලමල වරුණ කවි ගායනය

### දොං ජිං ජිං තකට දොංතක (3 + 4)

1. ලෙළ දෙමිනේ මල උඩු ගුවනේ
   මුතු කුඩ ලෙසිනේ සුළඟට වැනුණේ
   සොඳ ලෙසිනේ මිණි බරණ ලෙසේ
   ඇතට පෙනුණේ රන් කොත ලෙසිනේ
   අප ගොසිනේ මල දැක නෙතිනේ
   සිත පිරිය වුණේ නිම නැති ලෙසිනේ
   මෙම ලෙසිනේ තල මල පිපුණේ
   සකි පිය සකිනේ සොඳ ගල මුදුනේ

2. යන්ට සොඳයි ශ්‍රී මහ බෝ අනුර පුරේ
   ගොන් බැඳි රියකින් යා හැක අනුර පුරේ
   හොඳට හොඳයි තලමල ඇති බරට බරේ
   ඇතුපිට වඩවමු තලමල වීදි කරේ

## කුලු කවි ගායනා

1. ළමා ලියෝ ගවසා මල් වරල පිට
   දමා කරට මුතු පොට අත වළලු වට
   පෙමා වඩන ලෙස සරසා ඔසරි පට
   පමා නොව රඟති කුලු ගෙන සබේ පිට

2. රන් ගිරි මුදුනේ හිරු බබළන්නේ
   වල්ලි ළඳුන් හණි හණිකට එන්නේ
   අව්ව ද වැස්ස ද කියා බලන්නේ
   කුල්ල අරන් අපි නැටුමට එන්නේ

3. මොන ලී පතුරෙන් කුල්ල වියන්නේ
   බටලී පතුරෙන් කුල්ල වියන්නේ
   මොන ලී පතුරෙන් කුල්ල බඳින්නේ
   බටලී පතුරෙන් කුල්ල බඳින්නේ

## තාලම් කවි ගායනය

1. අගේ වඩන මගෙ තාලම් සරඹ බලන්නේ
වගේ නො දූන ඇයි නුඹලා කීමට එන්නේ
කගේ ගිල්ල ලෙස බැරි වෙයි නුඹට බොලන්නේ
මගේ දැත තාලම්පට හරඹ බලන්නේ

2. සඳවට තරුවැල් ඇවිදින් කල එළි සද්දේ
මද කොට පවසමි ඇවිදින් පැරදුණ සද්දේ
යුදයට වසවතු ඇවිදින් පැරදුණු යුද්දේ
බඳවට කැරෙකෙන මගෙ තාලම්පට සද්දේ

3. අහසේ තාලම් තාංගු තාලම්
සඳ වට කැරකී යයි තාලම්
පොළොවේ තාලම් තාංගු තාලම්
වැලියට කැරකී යයි තාලම්
මුහුදේ තාලම් තාංගු තාලම්
රැලි පිට සැඟවී යයි තාලම්
අපගේ තාලම් තාංගු තාලම්
බඳවට කැරකී යයි තාලම්

## මල් යහන් කවි ගායනය

1. මිහින්තලය අට සැට ලෙන සේල චෛත්‍ය වෙහෙරට
අඹතලාව මිරිස වැටිය භයා ගිරිය නම් වෙහෙරට
ජය ශ්‍රී මහ රුවන්වැලිය ථූපාරාමය වෙහෙරට
අටමස්ථානයේ සිටියත් වඩින්න දෙවි මල් යහනට

2. පුටුව සරසලයි මම සැල කරන්නේ
පුටුවේ තියෙන දළු බුලතුයි පුදන්නේ
කැටුව සිව්වරං සමගින් බලන්නේ
ශ්‍රියා දේවි මල් අස්නෙට වඩින්නේ

# 5 පරිච්ඡේදය

## 5.0 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායයන් හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම

### නර්තන සම්ප්‍රදායයන් හා සබැඳි සාරධර්ම

අතීතයේ දී නර්තන අධ්‍යාපනයේ තක්සලාව ගුරුගෙදර වූ අතර එහි දී ශිල්ප ශාස්ත්‍රය හදාරන ශිෂ්‍යයා (ආධුනිකයා) ගුරුවරයාගේ අනුදැනුම ඇති ව ජන්මපත්‍රය බලා සුදුසු හෝරාවකට අනුව දෙමාපිය අවසරයෙන් කලඑළි බැසීමට සුදුසුකම් ලබයි. උඩරට, පහතරට, සබරගමු යන සම්ප්‍රදාය තුන තුළ එන චාරිත්‍ර සුළු වශයෙන් වෙනස්කම් පවතින අතර කලඑළි අවස්ථා මෙසේ නාමික ව හඳුන්වා දෙනු ලැබේ.

- උඩරට සම්ප්‍රදායය - හිස වෙස් බැඳීමේ මංගල්‍යය (ශීර්ෂාභරණ පැලඳවීමේ මංගල්‍යය)
- පහතරට සම්ප්‍රදායය - මඩු බැසීමේ මංගල්‍යය
- සබරගමු සම්ප්‍රදායය - ගුරු වරම් දීමේ මංගල්‍යය වශයෙනි.

### උඩරට නර්තන සම්ප්‍රදායයේ හිස වෙස් පැලඳවීමේ මංගල්‍යය

ගුරුගෙදර අධ්‍යාපනය නිම කරන ආධුනිකයා තම ජන්ම පත්‍රයට අනුව නියම කරගත් දිනට තෙමසක් කලින් කිලිවලින් ආරක්ෂා වී උදේ සවස ස්නානය කර පිරිසිදු වී ආගමික වතාවත්වල යෙදීම සිරිතකි. එම වකවනුව තුළ ගුරුවරයා ආධුනිකයා වෙත ශිල්පය ලබාදීම සිදු කෙරේ. නැකැත් දිනට ආසන්න දින 7ක් ආධුනිකයා විහාරස්ථානයේ ආගමික වතාවත්වල යෙදී සවස අදාළ දෙවි දේවතාවන්ට පහන් පැලක් සකසා පහන් දල්වා ආශීර්වාද ලබා ගනී. නැකැත් දිනට ප්‍රථම දින රාත්‍රී හඟළ ඇතුළු රංග වස්ත්‍රාභරණ පේ කර, බෝධි පූජාවට සහභාගි වේ. නැකැත් දින උදෑසන ගුරුවරයා අතින් පැන් දොවා ගත් ආධුනිකයා විහාර ගෙට ගොස් හිස වෙස් පැලඳවීම සෙත් පිරිත් ගායනය මැද සිදු කෙරේ. ඉන් පසු සුදු රෙදිකඩෙන් ආවරණය කර විහාරගෙන් පිටතට පැමිණ අදාළ චාරිත්‍ර සිදු කර බෝ රුක හෝ මල් බුලත්තටුව හෝ දෙස බලා වහන්තරාව විවෘත කර පලතුරු පූජාවක් පිළිගන්වා ගුරු පා නැමැද මංගලම් නර්තනයෙන් රංගනය ආරම්භ කර, ශිල්පීය කුසලතා ප්‍රදර්ශනය කරයි. එහිදී ශිෂ්‍යයාට තෑගිබෝග පිරිනැමීම චාරිත්‍රයකි.

## මඩු බැසීම හෙවත් කලඑළි බැසීමේ මංගල්‍යය

පහතරට නර්තන ශිල්පය ප්‍රගුණ කළ ආධුනිකයකු සිය හැකියාවන් අන් අය ඉදිරියේ ප්‍රදර්ශනය කරන සුවිශේෂ අවස්ථාව මඩු බැසීම හෙවත් කලඑළි බැසීම නමින් හැඳින්වේ. මඩු බැසීමේ චාරිත්‍රය සඳහා මඩු යාගයක් යොදා ගන්නා අතර කලඑළි බැසීම සඳහා යක් තොවිලයක් යොදාගැනීම පවත්නා සිරිතකි.

මඩු බැසීමේදී දෙයාකාරයත චාරිත්‍ර විධි දක්නට ලැබේ. ආධුනිකයා කපු පත්තිනි කෙනෙක් නම් මඩු බැසීමේදී හලං වැඩමවා පත්තිනි නැටීම කළ යුතු අතර අවශේෂ ආධුනික ශිල්පියෙක් නම් වාහල නැටීම කළ යුතු ය. මෙම මූලික චාරිත්‍ර විධි නිම කිරීමෙන් පසු මඩු යාගයේ අනෙකුත් නර්තන අවස්ථා සඳහා ආධුනිකයන්ට සහභාගි විය හැකි ය. එමෙන් ම මාලක්කම්, බඹර වළල්ල වැනි සුවිශේෂ දක්ෂතා දැක්වීම ද මෙහිදී සිදු කෙරේ.

කලඑළි බැසීමේ දී බොහෝවිට යක් තොවිලයක් යොදාගන්නා බැවින් සන්නියකුම ඇතුළු අනෙකුත් යක් තොවිල්වලට අයත් නර්තන අවස්ථා ආධුනිකයා විසින් ප්‍රගුණ කළ යුතු ය. සියලු ම නර්තන ශිල්පීන් සහභාගි වන හැන්දෑ සමයම නැමැති නර්තන අවස්ථාවේ දී ආධුනිකයාට සිය දක්ෂතා දැක්වීමට අවස්ථාව ලැබේ. ඒ අනුව හැන්දෑ සමයමට අයත් නර්තනවලට අමතර ව මාලක්කම්, බඹර වළල්ල වැනි සුවිශේෂ දක්ෂතා ද මෙහි දී ඉදිරිපත් කරයි.

උඩරට හා සබරගමු නර්තන සම්ප්‍රදායයන්හි මෙන් සුවිශේෂ චාරිත්‍ර විධි පහතරට නර්තන සම්ප්‍රදායයේ දී දක්නට නැත. එහෙත් ආධුනිකයා නර්තනයට පිවිසෙන අවස්ථාවේ දී පමණක් තම ගුරුවරයාට ගුරු පඬුරු හා තෑගි බෝග ප්‍රදානය කිරීම සිරිතක් ව පවතින බව කිව යුතු ය.

## සබරගමු ගුරු වරම් දීමේ මංගල්‍යය

ගුරු ගෙදර අධ්‍යාපනය නිමා කරන ආධුනිකයා ශිල්පීය ප්‍රවීනතාවයට පත් වූ විට ඔහු ගුරු වරම් දීම සුදුසු යැයි ගුරුවරයා තීරණය කරයි. ශිල්ප ඥාණය ලැබූ පරම්පරාවට ආවේණිකව පවත්වන ශාන්ති කර්මයක දී ගුරු වරම් ලබාදීම සූදානම් කිරීම සිරිතකි. එනම් මඩු ශාන්ති කර්ම ගුරු පරම්පරාවකට අයත් නම් පහන් මඩුවේ ද, යක් තොවිල් සිදු කරන පරම්පරාවක් නම් යක් තොවිලයක දී ද, බලි ශාන්ති කර්ම සිදු කරන පරම්පරාවක් නම් බලි ශාන්තිකර්මයක දී ද ආදි වශයෙනි.

මෙහි දී ගුරුවරයා ආධුනික ශිල්පියාගේ දෙමාපියන් දැනුවත් කරයි. අනතුරුව ශාන්ති කර්මය පවත්වන මවක් ඒ සඳහා සූදානම් වීමට මඟපෙන්වයි. මෙහි දී මඩුව පවත්වනු ලබන්නේ ආධුනිකයාගේ ශිල්පීය ප්‍රාගුණ්‍ය ප්‍රදර්ශනය කළ හැකි අයුරිනි.

මඩුව පවත්වන දින සවස සුභ නැකතට අනුව හඟල හා නෙත්තිමාලය (හිස් පළඳනාව) පළඳවනු ලැබේ. අනතුරු ව පුවක්මල් කිනිත්තක් අතට දී ගුරුවරයා ආධුනිකයාගේ හිසමත අත තබා ගුරු වරම් දී ආශීර්වාද කිරීම සම්ප්‍රදායික සිරිතයි.

ආධුනිකයා වරම් ලබන ශාන්ති කර්මයේ මූලික චාරිත්‍ර සිදු කරනු ලබන්නේ ආධුනිකයාගේ මූලිකත්වයෙනි. මෙහි දී කවි ගායනය, නර්තනය, සංවාද සහ යක් කවි මෙහි ලා අන්තර්ගත වේ. ශාන්ති කර්මය අවසානයේ ගුරුවරයා විසින් ආධුනිකයාට සෙත් කරයි. ආධුනිකයාගේ දෙමාපියන් නෑ හිතුවතුන් ඔයුට ආශීර්වාද කරමින් සතුට ප්‍රකාශ කිරීමට තෑගි බෝග ද පිරිනැමීම සිදු කරයි.

## ශාන්තිකර්ම

ශාන්තිකර්ම යනු කිසියම් පුද්ගලයකුගේ මානසික හෝ කායික හෝ සුභ සිද්ධිය අරමුණු කොට දෙවියන්, යක්ෂයන් නැතහොත් වෙනත් බලවේග දුරු කර ශාන්තියක් උදෙසා පවත්වන කිසියම් කාර්ය සංසිද්ධියකි.

### දේශීය නර්තන සම්ප්‍රදාය තුනට අයත් ශාන්තිකර්ම

| සම්ප්‍රදාය | ශාන්තිකර්මය |
|---|---|
| උඩරට නර්තන සම්ප්‍රදායය | කොහොඹා කංකාරිය |
| පහතරට නර්තන සම්ප්‍රදායය | දෙවොල් මඩු ශාන්තිකර්මය |
| සබරගමු නර්තන සම්ප්‍රදායය | පහන් මඩුව ශාන්තිකර්මය |

### ශාන්තිකර්ම පැවැත්වීමට හේතු වූ කරුණු

**උඩරට කොහොඹා කංකාරිය ශාන්තිකර්මය**

අතීතයේ පැවැත්වීමට හේතුව

- පඬුවස් දෙව් රජුට වැදුණු දිවිදොස් නිසා හටගත් රෝග සුවපත් කිරීම

වර්තමානයේ පැවැත්වීමට හේතුව

- ධන, ධාන්‍ය, ගව, මහිෂාදි භව භෝග සම්පත් වැඩි දියුණු කර ගැනීම
- පුද්ගලයන්ට බලපෑ යම් රෝගාබාධයන් සුව කර ගැනීම
- ගමකට, ප්‍රදේශයකට, මුළු රටට ම පැමිණ ඇති ව්‍යසනයකින් මිදී සෙත් ශාන්තියක් ලබා ගැනීම
- ආධ්‍යාපනික අවශ්‍යතා (අධ්‍යයන හා පර්යේෂණ සඳහා)

**පහතරට දෙවොල් මඩු ශාන්තිකර්මය**

අතීතයේ පැවැත්වීමට හේතුව

- සේරමාන රජුට ඇති වූ හිසරදය සුව කිරීම

වර්තමානයේ පැවැත්වීමට හේතුව

- ගමට රටට සෙත් ශාන්තියක් පැතීම
- ධීවරයන්ට වාරකන් කාලයේ දී රැකවරණය හා ශාන්තිය පැතීම
- සශ්‍රීකත්වය උදෙසා
- රෝග නිවාරණ සෙත් ශාන්තියක් ලෙස
- අධ්‍යාපනික අවශ්‍යතා (අධ්‍යයනය හා පර්යේෂණ සඳහා)

**සබරගමුව පහන් මඩුව ශාන්තිකර්මය**

**අතීතයේ පැවැත්වීමට හේතුව**

- සේරමාන රජුට ඇති වූ හිසරදය සුව කිරීම

**වර්තමානයේ පැවැත්වීමට හේතුව**

- අම්මාවරුන්ගේ ලෙඩ ලෙස ගැමියන් හඳුන්වන රෝගවලින් අත්මිදීම සඳහා අනවශ්‍ය ආහාරවලින් මිදී පත්තිනි දේවතාවිය වෙනුවෙන් පේවී සෙත් ශාන්ති කිරීම
- ආධ්‍යාපනික අවශ්‍යතා (අධ්‍යයනය හා පර්යේෂණ සඳහා)

**ශාන්තිකර්මවල පුද ලබන දෙවිවරු**

| සම්ප්‍රදාය | ප්‍රධාන ශාන්තිකර්මය | පුද ලබන දෙවිවරු |
|---|---|---|
| උඩරට | කොහොඹාකංකාරිය | කොහොඹා දෙවියෝ<br>අලුත් කොහොඹා,<br>මහ කොහොඹා,<br>පරණ කොහොඹා යන<br>කොහොඹා දෙවි තුන්<br>කට්ටුව |
| පහතරට | දෙවොල් මඩුව | පත්තිනි දේවතාවිය<br>දෙවොල් දෙවියෝ<br>දැඩිමුණ්ඩ දෙවියෝ<br>දොළහ දෙවියෝ |
| සබරගමු | පහන් මඩුව | පත්තිනි දේවතාවිය<br>විෂ්ණු දෙවියෝ<br>සමන් දෙවියෝ<br>කතරගම දෙවියෝ<br>විභීෂණ දෙවියෝ<br>නාථ දෙවියෝ<br>දෙවොල් දෙවියෝ |

## කොහොඹා කංකාරියේ පුරාවෘත්තය

විජය රජු කුවේණිය සරණ පාවා ගෙන වාසය කිරීමේ දී ඔහුට ජීවහත්ත සහ දිසාලා නම් දරු දෙදෙනා උපදිති. ඉක්බිති ඔහු කුවේණිය පලවා හැර මදුරාපුරයෙන් ගෙන්වා ගත් සම කුල කුමාරියක සරණ පාවා ගනී. විජය රජු කෙරෙහි කෝපයට පත් කුවේණිය ඔහුට ශාප කළා ය. විජයගේ ඇවෑමෙන් රජ පැමිණි පඬුවස් දෙව් රජුට, කුවේණිය විසින් විජය රජුට කරන ලද ශාපය වැදිණි.

සිහිනෙන් දිවි වෙසක් දැක බියපත් වූ පඬුවස් දෙව් රජු බලවත් සේ රෝගාතුර විය. කොහොඹා කංකාරියේ දිවි දෝෂය නමින් හැඳින්වෙන්නේ මෙය යි. මෙම දිවි දෝෂය දුරු කිරීම සඳහා නොයෙකුත් සෙත් ශාන්ති කරවන ලද නමුත් සුවයක් නො ලැබිණි. අනතුරු ව ශක්‍ර දේවේන්ද්‍රයාට මෙය සැල කර සිටියේ ය. දිවියකු සිහිනෙන් දැක බිය වීමෙන් හටගත් රෝගයක් හෙයින් මවු කුසෙන් උපන් කෙනෙකුට දුරු කළ නොහැකි නිසා මලෙන් උපන් කෙනෙකු සොයා යාගය කරන ලෙස උපදෙස් දෙන ලදී.

මෙම කාර්යය රාහු අසුරේන්ද්‍රයාට භාර කරන ලදී. රාහු අසුරේන්ද්‍රයා විෂ්ණු දෙවියන්ගේ දස අවතාරවලින් එකක් වන දියෙන්, ගින්නෙන්, ආයුධවලින් හෝ හීයකින් හෝ නො නස්නා බල ඇති ඌරු අවතාරය ලබා දෙන්නේ නම් කාර්යය භාර ගන්නා බව කියා සිටියේ ය. අවසරය ලැබුණු රාහු අසුරේන්ද්‍රයා සත් මුහුදෙන් එතෙර වී, මලය රටට ගොස් රජුගේ නන්දන උයන විනාශ කරන්නට පටන් ගති. උයන ආරක්ෂා කරන උයන් පල්ලා සිදු ව ඇති විපත මලය රජුට දැන්වී ය. රජු ඌරා ඇල්ලීම සඳහා නුවර අණබෙර ලවා වැදි සේනාව රැස් කර උයන වට කළේ ය. ඌරා මලය රජුගේ නුවරට වැද මාළිගා බිඳ දුවන විට මලය රජු, කිත්සිරු, සඳලිඳු යන තුන්දෙන අතින් දුනු හී ගෙන ඌරා లුහුබැඳ ලක්දිව පැමිණියේ ය. සත් මුහුද පීනා ගිය ඌරා ලක්දිවට පැමිණ හන්තාන කන්ද අසල දී ගලක් බවට පත් විය. මලය රජු කඩුවෙන් කොටා විස්මයට පත් වූ අවස්ථාවේ එතැනට පැමිණි සක්දෙව් රජු මලය රජු ඇතුළු පිරිස මෙහි ගෙන්වීම පිණිස මෙවැනි මායාවක් කළ බවක් විස්තර කළේ ය. මලය රජු ඇතුළු පිරිස පඬුවස් දෙව් රජුගේ දිවි දොස් සුවපත් කිරීම පිණිස අනුරාධපුරයේ මහමෙවුනා උයනේ නියමිත දිග පළල සහිත මණ්ඩපයක් කරවා ශාන්ති කර්මය කිරීමෙන් අනතුරු ව දිවි දෝෂය සුවපත් විය.

## දෙවොල් මඩුවේ පුරාවෘත්තය

සේරමන් රජුගේ උයන පාළුකරමින් සිටි ගෝනකු මරා දමන ලෙස රජු විසින් අණ කරන ලදින් හේවායින් ගෝනා පසුපස පන්නා යන අවස්ථාවේ ගෝනාගේ පය පැටලී අසල තිබුණ රජුගේ පොකුණ තුළට වැටී මරණයට පත් විය. තමාට විපත් කළේ රජු බව දැනගත් ගෝනා ඔහු කෙරෙහි කෝපයෙන් මරණයට පත් වී පොකුණෙහි ම කුඩා මැඩියකු වී උපදී. දිනක් රජු පොකුණට යද්දී ලස්සණ මලක් දැක එය කඩා සුවඳ ආඝ්‍රාණය කළ සැණෙකින් එහි සිටි කුඩා මැඩියා රජුගේ නාසයට ගියේ ය. ඉන් හටගත් හිසරදයක් සුව කිරීමට නොහැකි ව සිටිය දී දිනක් රජුට සිහිනෙන් රූමත් කාන්තාවක් පෙනුණා ය ය. ඒ බව පුරෝහිතයන්ට දැන්වී ය. ඔවුන් පැවසුවේ සිහිනයෙන් පෙනී ඇත්තේ පත්තිනි දේවිය බවත් බෞද්ධාගම ස්ථාපිත රටකට ගොස් පින් පැමිණවිය යුතු බවත් ය. එහි දී ලංකාව තෝරා ගෙන කැලණියට ගොස් බුදුන් වැඳ දෙවියන්ට පින් දී රුවන්වැල්ලේ දී දෙවොල් මඩුව ආරම්භ ක ළ බව කියැවේ.

*** සබරගමු පහන් මඩුවේ පුරාවෘත්ත කතාව පහතරට දෙවොල් මඩුවේ පුරාවෘත්ත කතාව හා බැඳේ.**

## ශාන්තිකර්ම හා සබැඳි නර්තනය, ගායනය, වාදනය, චාරිත්‍ර විධි සහ සැරසිලි (උඩරට)

| ශාන්තිකර්ම | චාරිත්‍ර විධි | නර්තන අංග | ගායනය | වාදනය | සැරසිලි | නාට්‍යමය අවස්ථා |
|---|---|---|---|---|---|---|
| • කොහොඹා කංකාරිය | • කප් සිටුවීම<br>• මඩුව සෑදීම<br>• මඩු පේ කිරීම<br>• තොට පේ කිරීම<br>• මල පේ කිරීම<br>• ආභරණ වැඩමවීම<br>• මල්යහන් කවි හා දෙවියන් පේ කිරීම | • යක් ඇන්නුම<br>• අස්නේ<br>• ආවැන්දුම<br>• හත්පද<br>• දුනුමාලප්පුව<br>• කොහොඹා හැල්ල<br>• යක්තුන් පදය<br>• හත් පදය<br>• දාන පහ<br>• මඩුපුරය | • නමස්කාර<br>• අෂ්ටක<br>• ශ්ලෝක<br>• සන්න<br>• සැහැලි<br>• යාදිනි<br>• සිරසපාද<br>• කඩතුරා<br>• කෝල්මුර<br>• උපත් කවි | • නර්තනය සඳහා කෙරෙන වාදනය<br>• ගායනය සඳහා පමණක් යෙදෙන වාදනය<br>• මඟුල් බෙර වාදන<br>• පිං බෙර<br>• වැඳුම් අත්<br>• දෑකුම් අත් වාදනය | • මඩුව වටා ගොප්කොළ සැරසිලිවලින් අලංකාර කරනු ලැබේ. මඩු සැරසීම, අයිල මල්යහන්, පිදේනි තටු සැකසීම සඳහා ද සැරසිලි යොදා ගනු ලැබේ. පොදුවේ ගත් කල කෙසෙල් පතුරු ගොප්කොළ අමුද්‍රව්‍ය ලෙස යොදා ගනියි. ලී කෝටු, පට්ටා, කෙසෙල් කොළ, හබරල කොළ ද භාවිත කරයි. රංග භාණ්ඩ නිර්මාණය ද සැරසිලිවලට අයත් වේ. පොදුවේ ගත් කල පරිසරයෙන් ලබා ගන්නා ලද ස්වාභාවික අමුද්‍රව්‍ය සැරසිලි සඳහා යොදා ගනු ලැබේ. | • යක්කම්<br>• ගුරුගේ මාලාව<br>• ගබඩා - කොල්ලය |

## ශාන්තිකර්ම හා සබැඳි නර්තනය, ගායනය, වාදනය, චාරිත්‍ර විධි සහ සැරසිලි (පහතරට)

| ශාන්තිකර්ම | නර්තන අංග | ගායනය | වාදනය | චාරිත්‍ර විධි | සැරසිලි | නාට්‍යමය අවස්ථා |
|---|---|---|---|---|---|---|
| • දෙවොල් මඩුව | • තොරණ යාගය<br>• තෙල්මෙ<br>• දෙවොල්,<br>• වාහල, පත්තිනි<br>• අඹ විදමන | • නමස්කාර<br>• අෂ්ටක<br>• ශ්ලෝක<br>• සන්න<br>• සැහැලි<br>• යාදිනි<br>• සිරසපාද<br>• කඩතුරා<br>• කෝල්මුර<br>• උපත් කවි | • නර්තන සඳහා කෙරෙන වාදන<br>• ගායනය සඳහා පමණක් යෙදෙන වාදන<br>• මඟුල් බෙර වාදන<br>• පිං බෙර<br>• වැඳුම් අත්<br>• දැකුම් අත් | • තොටමෙට යාම<br>• මිල්ල කැපීම<br>• බිසෝ කප් සිටුවීම<br>• පූනාව පේ කිරීම<br>• පහන් පත්තු කිරීම<br>• කාල පන්දම<br>• තොරන් යාගය<br>• මල්යහන් පූජාව<br>• දේවාභරණ පූජාව<br>• දේවාභරණ වැඩමවීම | • වීදි හා තොරණ ආදියෙන් රංග භූමිය අලංකාර කරනු ලැබේ. මඩු සැරසීම, අයිල මල්යහන්, පිදේනි තටු සැකසීම සඳහා ද සැරසිලි යොදා ගනු ලැබේ. පොදුවේ ගත් කල කෙසෙල් පතුරු ගොප්කොළ අමුද්‍රව්‍ය ලෙස යොදා ගැනේ. ලී කෝටු, පට්ටා, කෙසෙල් කොළ, හබරල කොළ ද භාවිත කෙරෙයි. රංග භාණ්ඩ නිර්මාණය ද සැරසිලිවලට අයත් වේ. පොදුවේ ගත් කල පරිසරයෙන් ලබා ගන්නා ලද ස්වාභාවික අමුද්‍රව්‍ය සැරසිලි සඳහා යොදා ගනු ලැබේ. | • අඹ විදමන<br>• දෙවොල් ගොඩ බැසීම<br>• ඇත් බන්ධනය<br>• මී බන්ධනය |

## ශාන්තිකර්ම හා සබැඳි නර්තන, ගායන, වාදන, චාරිත්‍ර විධි, සැරසිලි (සබරගමු)

| ශාන්තිකර්ම | නර්තන අංග | ගායන | වාදන | චාරිත්‍ර විධි | සැරසිලි | නාට්‍යමය අවස්ථා |
|---|---|---|---|---|---|---|
| • පහන් මඩුව | • දේව කෝල්පාඩුව<br>• මුදුන් තාලය<br>• යහන් දැක්ම<br>• හත් පද පෙළපාලිය<br>• මල් පද<br>• පන්දම් පද | • නමස්කාර<br>• අෂ්ටක<br>• ශ්ලෝක<br>• සන්න<br>• සැහැලි<br>• යාදිනි<br>• සිරසපාද<br>• කඩතුරා<br>• කෝල්මුර<br>• උපත් කවි<br>• මල් යහන් කවි | • නර්තන සඳහා කෙරෙන වාදන<br>• ගායනය සඳහා පමණක් යෙදෙන වාදන<br>• මඟුල් බෙර වාදන<br>• පිං බෙර<br>• වැඳුම් අත්<br>• දැකුම් අත් | • මඩු පේ කිරීම<br>• මිල්ල කැපීම<br>• තෙට පේ කිරීම<br>• ආභරණ වැඩම වීම<br>• පහන් දැල්වීම<br>• පන්සිල් ගැනීම<br>• බිසෝ කප්<br>• සිටුවීම<br>• කාල පන්දම් සිටුවීම<br>• හලං පාවා දීම<br>• සෙත් කිරීම | • වීදි හා තොරණ ආදියෙන් රංග භූමිය අලංකාර කරනු ලැබේ. මඩු සැරසීම, අයිල මල්යහන්, පිදේනි තටු සැකසීම සඳහා ද සැරසිලි යොදා ගනු ලැබේ. පොදුවේ ගත් කල කෙසෙල් පතුරු ගොප්කොළ අමුද්‍රව්‍ය ලෙස යොදා ගැනේ. ලී කෝටු, පට්ටා, කෙසෙල් කොළ, හබරල කොළ ද භාවිත කෙරෙයි. රංග භාණ්ඩ නිර්මාණය ද සැරසිලිවලට අයත් වේ. පොදුවේ ගත් කල පරිසරයෙන් ලබා ගන්නා ලද ස්වාභාවික අමුද්‍රව්‍ය සැරසිලි සඳහා යොදා ගනු ලැබේ. | • අඹ විදමන<br>• දෙවොල්ගොඩ බැසීම<br>• රාමා යක්කම (මරා ඉපැද්දීම)<br>• අසුර යක්කම<br>• පොත් කරයි යක්කම |

## නර්තන සම්ප්‍රදාය ප්‍රවර්ධනයට දායක වූවෝ

### රද්දැල්ලේ පොඩි මහත්මයා මහතා

- සබරගමු නර්තන ශිල්පියකු ලෙස කටයුතු කළ රද්දල්ලේ පොඩි මහත්තයා ශිල්පීය ඥානය ලැබුවේ පියාගෙනි. මුල් යුගයේ මෙම සබරගමු නර්තනය සීමා වී තිබුණේ ශාන්තිකර්මවල රඟදැක්වීමටත්, විහාරස්ථාන ආශ්‍රිත ව පැවැති පින්කම් ආදියටත් පමණි.

- 1947 වර්ෂයේ දී සබරගමු නර්තනය ඉගැන්වීමට සබරගමු කලායතනයක් ආරම්භ කළ මෙතුමාට 1959 වර්ෂයේ දී දික්වැල්ල මහා විද්‍යාලයේ නර්තන ගුරුවරයකු ලෙස පත්වීමක් ලැබිණි.

- 1964 දී ගිරාගම ගුරු විද්‍යාලයයේ කථිකාචාර්යවරයකු ලෙස සේවයට බැඳුණු මෙතුමා ඉගැන්වීම සඳහා නියමිත කාලයට සීමා නොවී අමතර කාලය ද යොදා ගනිමින් සබරගමු නර්තන සම්ප්‍රදායය ඉගැන්වීම සඳහා ගුරු විද්‍යාලයීය කථිකාචාර්යවරයකු වශයෙන් මහත් කැපවීමකින් කටයුතු කළේ ය.

- ඉන් පසු ව 1977 - 1990 දක්වා සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ කථිකාචාර්යවරයකු ලෙස කටයුතු කළ එතුමා සිසුන් එකතු කර ගනිමින් ප්‍රාසංගික ව ඉගැන්වීම් කටයුතුවල නිරත විය. මේ නිසා වැඩි සිසුන් පිරිසක් නර්තන අධ්‍යාපනයට ප්‍රවිෂ්ට කරවීමට හැකි විය. සබරගමු නර්තන විෂයමාලා සකස් කිරීමට මූලිකත්වයක් ලබා දුන් මෙතුමා ඒ පිළිබඳ වාද විවාද පවා සිදු කළේ ය.

- රද්දල්ලේ පොඩි මහත්තයා කථිකාචාර්ය තුමා සබරගමු නර්තනයටත්, ගායනයටත්, දවුල් වාදනයටත් එක හා සමාන දක්ෂතාවක් දැක්වූ කලා ශිල්පියෙකි. මෙතුමා නර්තන නිර්මාණයට සුවිශේෂ දක්ෂතාවක් දැක්වී ය.

- පාසලට, ගුරු විද්‍යාලයයට, විශ්වවිද්‍යාලයයට පමණක් එතුමා සේවය සීමා කළේ නැත. ලැබෙන සෑම අවස්ථාවක ම පහන් මඩු, ගම්මඩු ශාන්තිකර්මවලත් නර්තනයෙන් යෙදිණි.

- රද්දල්ලේ පොඩි මහත්තයා නමින් මෙන් ම පරංගියා වත්තේ පොඩිමහත්තයා යන නමින් ද මෙතුමා හැඳින්වෙයි.

## ජේ.ඊ. සේදරමන් මහතා

1908.09.23 දින උපත ලබා ඇති මොහු ප්‍රවීණ උඩරට නර්තන ශිල්පියෙකි. මහනුවර පූජාපිටිය මහ විද්‍යාලයයෙන් මූලික අධ්‍යාපනය ලබා ඇත.

### ඉගෙන ගන්නා ලද ශිල්ප ශාස්ත්‍ර

පියා වූ මාදන සිරිසේන ගුරුතුමාගෙන් උඩරට නර්තනය, බෙර වාදනය, චිත්‍ර ශිල්පය, මූර්ති ශිල්පය, නක්ෂත්‍රය ආදියත් පන්සල ආශ්‍රයයෙන් සිංහල, පාලි හා සංස්කෘත භාෂාව සහ කාව්‍යකරණයත් උගත් මෙතුමා දක්ෂ කලාකරුවෙකි.

### විදේශ සංචාර සහ ඉදිරිපත් කරන ලද නර්තන

- 1930 වර්ෂයේ දී ප්‍රංශය බලා පිටත් ව ගිය ඔහු එහි දී සර්කස් කණ්ඩායමකට බැඳී නර්තනයක් ඉදිරිපත් කර ඇත. ජර්මනිය, බෙල්ජියම, ස්විට්සර්ලන්තය, හංගේරියාව, ඉතාලිය සහ එංගලන්තය වැනි රටවල ද සංචාරයේ යෙදෙමින් නර්තන ඉදිරිපත් කර ඇත.

- එංගලන්ත සංචාරයේ දී රාගිනි දේවිය සමග රාධා ක්‍රිෂ්ණ නර්තනය සහ නාග නර්තනය ඉදිරිපත් කිරීමට මෙන් ම ඇයගේ නර්තන වැඩ සටහන්වල නර්තන අංග හයක් ඉදිරිපත් කිරීමට ද අවස්ථාව ලැබී ඇත. ඔහු විසින් ලියන ලද ''සුන්දර යුරෝපය'' නම් කෘතියේ රාවණ නෘත්‍යයක් ද ඉදිරිපත් කර ඇති බව සඳහන් වෙයි. සංචාරක නැටුම් කණ්ඩායමක් සකස් කර ප්‍රේක්ෂකයන් ඉදිරියේ රැඟුම් දැක්වීම, සර්කස්වල සහ ප්‍රදර්ශනවල රංගනයන් ඉදිරිපත් කිරීම් ආදි කටයුතු ද කර ඇත.

### අධ්‍යාපන ක්ෂේත්‍රය උදෙසා ඉටු කර ඇති සේවය

- 1941 ජූනි 01 දින ගුරුවරයකු ලෙස මුල් ම පත්වීම ලබා ගනිමින් මාවතගම මහා විද්‍යාලයයේ උඩරට නර්තනය විෂයයක් ලෙස ඉගැන්වීම.
- ගිරාගම, පේරාදෙණිය, පොල්ගොල්ල, මීරිගම, නිට්ටඹුව යන ගුරු අභ්‍යාස විද්‍යාලයවල නැටුම් සහ සංගීත පරීක්ෂකවරයකු ලෙස සේවය කිරීම.
- ගිරාගම ගුරු අභ්‍යාස විද්‍යාලයයේ නැටුම් හා සංගීත කථිකාචාර්යවරයකු ලෙස සේවය කිරීම.

### රචිත ග්‍රන්ථ

* සිංහල නාට්‍ය කලාව - 1944
* නෘත්‍ය චින්තාමණි - 1949
* උඩරට නැටුම් කලාව - 1962
* නෘත්‍ය රත්නාකරය - 1959

*	ලංකාවේ යක්ෂ යුගය හෙවත් කොහොඹා කංකාරි උපත - 1955
*	ශුභ ශාන්ති විධි නොහොත් ලංකාවේ බලි උපත - 1964
*	බලියාග විචාරය නොහොත් ලංකාවේ බලි උපත - 1967

- නිර්මාණය කරන ලද මුද්‍රා නාට්‍ය කෘති
    * පණ්ඩුකාභය
    * තේලපත්ත
    * විජය කුවේණි

- කලාත්මක කටයුතු සඳහා පිහිටුවන ලද සංවිධාන
    * ලංකා මහජන කලා මණ්ඩලය
    * රාවණ කලා සංගමය

## එම්.එච්. ගෝමිස් මහතා

පහතරට නර්තන සම්ප්‍රදායයේ මාතර ශෛලියේ නර්තන ශිල්පියකු ලෙස ගෝමිස් මහතා හැඳින්විය හැකි ය. රටයකුම හෙවත් රිද්දි යාගය, සූනියම් කැපිල්ල, මහසොහොන් සමයං වැනි ශාන්තිකර්ම පිළිබඳ පුළුල් දැනුමක් එතුමා සතු ව පැවති අතර, ප්‍රවීණ ශාන්තිකර්ම ඇදුරකු ලෙස ප්‍රසිද්ධියට පත් ව ඇත.

නර්තන ශිල්පියකු ලෙස ගෝමිස් මහතා ප්‍රසිද්ධියට පත් වූයේ පහතරට සුවිශේෂ නර්තන අංග කිහිපයක් නිසා ය. නාගකන්‍යා, ගිනි සිසිල, පන්දම් පාලිය වැනි නර්තන අංග ඉන් කීපයකි. කෝලම් නාටකයේ එන නාග කන්‍යා නැටුම ඉතා ම සිත් ගන්නාසුලු ආකාරයට නිර්මාණය කරමින් වේදිකාවට උචිත ලෙස රංග වින්‍යාසය කළේ ගෝමිස් මහතා ය. එසේ ම ගිනි සිසිල නමැති නර්තන අංගය ද වේදිකාවට උචිත ලෙස සකස් කොට ඉදිරිපත් කිරීමේ ගෞරවය ද ගෝමිස් මහතාට හිමි විය යුතු ය.

පහතරට නර්තනය වේදිකාවට උචිත ලෙස සකස් වී නොතිබුණු අවධියක ඒවා ක්‍රමවත් ව ඉදිරිපත් කිරීම සඳහා මෙතුමා දරා ඇති උත්සාහය අගය කළ යුතු ය.

ලෝකයේ රටවල් ගණනාවක ම තමන්ගේ නර්තන හැකියාවන් ප්‍රදර්ශනය කළ මෙතුමා අන්තර්ජාතික වශයෙන් සම්මානයට පාත්‍ර වූවෙකි. සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ බාහිර කථිකාචාර්යවරයකු ලෙස වසර ගණනාවක් සේවය කළ ගෝමිස් මහතාගෙන් පහතරට නර්තන කලාවට සිදු වූ සේවය බොහෝ දෙනා අගය කරති.

## කාර්ය පත්‍රිකාව

වගුව ඇසුරු කර ගනිමින් හිස්තැන් පුරවන්න.

| ශිල්පීන්ගේ නම් | අයත් සම්ප්‍රදායය | ශිල්පීය දක්ෂතා | නර්තන කලාවට සිදු වූ සේවාව | නිර්මාණය කරන ලද කලා කෘති |
|---|---|---|---|---|
| ජේ.ඊ. සේදරමන් | | | | උඩරට තාල ශාස්ත්‍රය |
| | | දවුල් වාදනය | | |
| | පහතරට නර්තන සම්ප්‍රදායය | | නර්තන කථිකාචාර්යවරයකු හා ප්‍රධාන පරීක්ෂකවරයකු ලෙස සේවය කිරීම | |

# 6 පරිච්ඡේදය

## 6.0 විවිධ කලාංගවල සෞන්දර්යාත්මක වටිනාකම්

### කතරගම දේවාල පෙරහැර

කතරගම දේවාල පෙරහැර සිංහල, හින්දු, මුස්ලිම්, ආදිවාසීන් ආදි සියලු ජනයාගේ ආගමික පෙරහැරක් ලෙස හැඳින්වේ.

### අරමුණු

- බැතිමතුන්ගේ අපල උපද්‍රව දුරු කිරීම
- දේවාශීර්වාදය ලැබීම හා රටට සෙත්පැතීම
- වර්ෂාව හා සශ්‍රීකත්වය ලබා ගැනීමට
- ස්වාභාවික විපත්වලින් රට බේරා ගැනීම

### පෙරහැර පැවැත්වෙන කාලය

කප් සිටුවීමෙන් දින 44ක් ගෙවුණු තැන දී එළඹෙන අමාවක ගෙවී, පුර පැළවිය දිනයේ පුස නැකතින් කතරගම දේවාලයයේ පෙරහැර ආරම්භ වේ. ඇසළ මාසයේ මංගල්‍යය පැවැත්වෙන මුළු කාලය තුළ ම කතරගම දෙවියන් මිනිස් ලොවට පැමිණ සිටුවන ලද කපෙහි වාසය කරන බවට විශ්වාසයක් පවතී. එ නිසා සිටවන ලද කප් පූජා වස්තුවක් ලෙස සලකනු ලැබේ.

### කතරගම පෙරහැර හා බැඳි චාරිත්‍ර

කතරගම දේවාලයයේ සාම්ප්‍රදායික වශයෙන් වාර්ෂික ව පැවැත්වෙන ප්‍රධාන මංගල්‍ය උත්සව තුනකි. අවුරුදු මංගල්‍යය, ඇසළ උත්සවය, ඉල් මහ මංගල්‍යය වශයෙනි.

ගිනි පෑගීම, බිම පෙරළීම, කටු ගැසීම ආදි දුෂ්කර කාර්යයන්හි නියැළෙන්නේ දෙවියන් වෙනුවෙන් දැඩි භක්තිය ප්‍රකාශ කිරීම සඳහා ය.

මඟුල් පෙරහැර පැවැත්වෙන දිනයෙහි දී විශේෂ කැවුම්, කිරිබත් සකස් කිරීම චාරිත්‍රයක් වශයෙන් සිදුවන්නකි. මෙම කැවිලි සකස් කරනුයේ දේවාලයයේ තේවාකරුවකු වන ගම්පහ විදානේ ය. පෙරහැර පටන් ගැනීමේ දී ''වත බැඳීම'' නම් චාරිත්‍රයක් වේ. වත බැඳීම යනු දේවාභරණ ගෙන යන ඇතු පිට වස්ත්‍ර ඇතිරීම ය.

## ගායන හා වාදන අවස්ථා

ඇසළ පුරපසළොස්වක ගෙවී අවපෑළවිය ලබන දිනයේ දී ''වේගවත් පෙරහැර'' නමින් හැඳින්වෙන විශේෂ පෙරහැරක් පැවැත්වේ. දුවන පෙරහැර යනු මෙයට තවත් නමකි. මෙම පෙරහැර මහා දේවාලයයෙන් නික්ම වල්ලි අම්මා දේවාලයය වෙත යයි. මෙහි දී විශේෂ හේවිසි වාදනයක් දැකිය හැකි ව. නිලධාරීන් ඉදිරියේ පැවැත්වෙන හේවිසි වාදනයේ දී වාදනය කරනු ලබන්නේ එම අවස්ථාවට පමණක් සැකසුණු බෙර පදයකි. මෙම බෙර පදය නම් කර ඇත්තේ ''වීරපදය'' නමිනි.

හේවිසි වාදනය මෙන් ම, දමිළ බෙරය නාගස්වරම් ආදි භාණ්ඩ වාදනය කිරීම මෙම පෙරහැරේ දැකිය හැකි ය. ඊට අමතර ව දේශීය වාද්‍ය භාණ්ඩ ද භාවිත කෙරේ.

දෙවියන් වැඩම කිරීම සිදු කරන්නේ මහා දේවාලයයෙන් ලබාගත් පිරිත් පැන් දේවාලයය පුරා ඉසීමෙන් හා දේවාලයය තුළ තැන්පත් කිරීමෙන් අනතුරු ව ය. එහි දී ''හරෝ හරා'' නාදයෙනුත් තූර්ය වාදන, ඝණ්ටා හා සීනු නාදයෙනුත් අවට පරිසරය ගිගුම් දෙයි.

පෙරහැර එළිය කරන පන්දම්කරුවන් ද, සුවඳ දිය සහ මල් ඉසින්නන් ද, මාර්ගය පවිත්‍ර කිරීම පිණිස කහ දියර ඉසින්නන් ද, ස්තෝත්‍ර සහ ද්‍රවිඩ ගීතිකා ගායනය කරන්නන් ද, පෙරහැර දෙපසින් ගමන් කරනු දැකිය හැකි ය. මෙහි දී සිංහල හා ද්‍රවිඩ ජනතාවගේ එකමුතුකම ද පෙනේ. මෙහි දිස් වන්නේ රජ පෙරහැරක ස්වරූපයකි. ඊට හේතුව රජ පෙරහැරක ඇතුළත් වූ සැම අංශයක් ම මෙම දේවාල පෙරහැරෙහි අන්තර්ගත ව තිබීම ය.

## නර්තන රංග වස්ත්‍ර හා සැරසිලි

පෙරහැරෙහි වැඩමකරවනු ලබන ශුද්ධ වස්තු, යන්ත්‍ර හා දේවරූප, වාසනාමේදිය වෙත ගෙන යනුයේ කපුරාල ය. දේවාලයේ සිට මේදිය තෙක් වූ මාර්ගය රතු පලසක් වැනි පාවාඩයකින් සහ සුදු වියනකින් සැරසීමත්, ශුද්ධ වස්තූන් ගෙන යන කපුරාල මුඛවාඩමකින් හා තලප්පාවකින් සැරසීමත් මේ අවස්ථාවේ දී දැකගත හැකි ය. අලි ඇතුන් ගෙන් මෙන් ම විදුලි බුබුළුවලින් හා වීදි සැරසිලිවලින් පෙරහැර අලංකාර වෙයි.

පෙරහැරේ ඉදිරියෙන් ම සිටින්නෝ ඉර හඳ නිරූපණය කෙරෙන සිංහල ඡත්‍ර, සේසත් දරන්නන්, හා දිසා කොඩි දරන්නෝ ය. පෞරාණික නියමයන් අනුව තම තමන්ට නියමිත කොඩි ඔසවා ගත යුත්තේ නින්දගම් ලද්දවුන් විසිනි. ඊළඟට නිලමේ ඇඳුමෙන් සැරසුණු බස්නායක නිලමේ සහ දේවාලයයේ ලේකම්වරයා දැකිය හැකි ය. ඔවුන් දෙදෙනා දෙපස කපුරු සහ පහන් අතැති හේවා කරුවෝ දෙදෙනෙක් සිටිති. දෙවියන් වැඩම වන ඇතුපිට මුඛවාඩමින් සැරසුණු කපුරාල ය. දෙවියන්ගේ ආරක්ෂාවට මෙන් එසේ ගමන් කරනුයේ මහ දේවාලයයෙහි සේවාව කරන ප්‍රධාන කපුරාල යි. ඇතු පිටුපසින් අත්වැල් බැඳගත් ''ආලත්ති අම්මලා'' ගමන් කරති.

උඩරට, පහතරට හා සබරගමු ආදි සාම්ප්‍රදායික නර්තන අංග මෙන් ම කුලු, ගොයම්, රබන්, සවරන්, චාමර, වේවැල්, තාලම්, ලී, කඩු ආදි විවිධ ගැමි නැටුම් වලින් ද සිංහ නැටුම,

හනුමන්තා නැටුම, මොනර නැටුම ආදි නිර්මාණ නැටුම්වලින් මෙම පෙරහැර අලංකාරවත් වේ. ද්‍රවිඩ සංස්කෘතිය හා බැඳි කාවඩි නැටුම, කෙහොඹ කළය ආදි නැටුම් මෙම පෙරහැරෙහි සුවිශේෂ වේ.

සාම්ප්‍රදායික බෙර වාදන ඇඳුම් කට්ටලය හා සාම්ප්‍රදායික නර්තන ඇඳුම් කට්ටල ද භාවිත කරන අතර විවිධ ආකාරයට නිර්මාණය කරන ලද රංග වස්ත්‍රාභරණ ද නැටුම් සඳහා භාවිත කරනු දක්නට ලැබේ.

ගායනය, වාදනය හා නර්තනය සඳහා ස්ත්‍රී, පුරුෂ දෙපිරිස ම සහභාගි වෙති.

## කතරගම දේවාල පෙරහැර (කාර්ය පත්‍රිකාව)

| පැවැත්වීමට හේතු | පැවැත්වෙන කාල සීමාව |
|---|---|
| 1. ..........<br>2. ..........<br>3. .......... | 1. ..........<br>2. ..........<br>3. .......... |
| පෙරහැරෙහි දක්නට ලැබෙන නර්තන අංග | පෙරහැරෙහි දක්නට ලැබෙන වාදන භාණ්ඩ |
| 1. ..........<br>2. ..........<br>3. ..........<br>4. ..........<br>5. .......... | 1. ..........<br>2. ..........<br>3. ..........<br>4. ..........<br>5. .......... |
| පෙරහැර හා සම්බන්ධ සුවිශේෂ පුද්ගල නාම | පෙරහැර හා සම්බන්ධ සුවිශේෂ චාරිත්‍ර විධි |
| 1. ..........<br>2. ..........<br>3. .......... | 1. ..........<br>2. ..........<br>3. .......... |
| පෙරහැරෙහි දක්නට ලැබෙන සැරසිලි අංග | භක්තිය දැනවීම සඳහා කරන කාර්ය |
| 1. ..........<br>2. ..........<br>3. .......... | 1. ..........<br>2. ..........<br>3. .......... |
| ද්‍රවිඩ සංස්කෘතිය හා බැඳි නර්තන අංග | ද්‍රවිඩ සංස්කෘතිය හා බැඳි වාද්‍ය භාණ්ඩ |
| 1. ..........<br>2. .......... | 1. ..........<br>2. .......... |

## වෙනත් සංස්කෘතිවලට අයත් නර්තන

### කරගම් නැටුම

ඉන්දියාවේ ගැමි නැටුම් අතරින් සුවිශේෂ වූ ගැමි නැටුමකි. තමිල්නාඩු ප්‍රාන්තය මූලික කර ගෙන මෙහි ආරම්භය සිදු වූ අතර තාන්ජාවූර් ප්‍රදේශයේ ආගමික පුද පූජා අවස්ථාවන්හි දී දක්නට ලැබේ.

### පුද ලබන දෙවිවරු

මාරි අම්මාන් හා ගංගා අම්මාන් දෙවිවරු

### උත්සව පවත්වන කාල සීමාව

අගෝස්තු මාසය තුළ ඉන්දියාවේ හා ලංකාවේ පැවැත්වෙන උත්සවයකි.

### කරගම් නැටුම හා බැඳි සුවිශේෂ ලක්ෂණ

සමබරතාව තබා ගනිමින් නර්තනය කිරීම මෙහි විශේෂත්වයකි. ඒ සඳහා කළයක් හිස මත තබා ගෙන සරල චලන භාවිතයට ගනියි. ගැහැනු පිරිමි දෙපක්ෂය ම මේ සඳහා සහභාගි වීම සිදු වේ. තනි තනි ව හා යුගල වශයෙන් නර්තනයේ යෙදෙති. ලෝහවලින් හෝ මැටිවලින් හෝ සකස් කරන ලද කළය විවිධ වර්ණයෙන් යුත් මල් වර්ගවලින් සරසනු ලැබේ.

උදා : රතු, සුදු, කහ මල් වැඩි වශයෙන් අලංකාරය සඳහා යොදා ගැනේ.

කළය මුදුනේ කඩදාසිවලින් සකස් කරන ලද ගිරවකු ගේ ආකෘතියක් දැකිය හැකි ය. එම ගිරවා කැරකෙන ආකාරයට කළය හිස මුදුනේ තබා ගැනේ.

සමබරතාව පවත්වා ගැනීම සඳහා කළය ඇතුළට සහල් දමනු ලැබේ. මල්වලින් සරසන ලද කළයේ කවාකාර බව ඉස්මතු කිරීමට බම්බු ලීයක් කළය තුළට සිරස් අතට දමා එය වටා මල් වැල්වලින් අලංකාර කර නර්තනයේ චමත්කාර බව වැඩි කර ගැනේ.

### සංගීතය හා වාද්‍ය භාණ්ඩ

බෙර වර්ග හා නළා වර්ග සංගීතය සඳහා යොදා ගන්නා අතර නෛයඩි මේලම් සංගීතය මෙහි දී සුවිශේෂ වේ. ඇතැම් විට ගායනය සඳහා ගීත ද යොදා ගැනේ.

### රංග වස්ත්‍රාභරණ

දමිළ ලක්ෂණ පෙන්නුම් කරන සාරිය නොහොත් දිග සාය, හැට්ටය හා ආභරණ කාන්තාවන් භාවිත කරන අතර පිරිමි දෝතිය හා පූන නූල භාවිත කිරීම දක්නට ලැබේ. රතු, කහ, කොළ වර්ණ වැඩි වශයෙන් යොදා ගනු ලැබේ.

## වෙනත් සංස්කෘති හා බැඳි නර්තන අංග

### කාවඩි/කරගම් රංග උපකරණයක් සකස් කර ගැනීමට උපදෙස්

- නර්තනාංගයක් පිළිබඳ ව රංග උපකරණයක් (CD තැටියක් හෝ පින්තූරයක් හෝ නැරඹීමේ දී පහත සඳහන් කරුණු පිළිබඳ ව අවධානය යොමු කිරීම වැදගත් ය.)
- හැඩතලය
- රංග උපකරණය සකස් කර ඇති අමුද්‍රව්‍ය
- අලංකාර කර ගැනීමට භාවිත කර ඇති වර්ණ හා ද්‍රව්‍ය පිළිබඳ ව හොඳින් නිරීක්ෂණය කිරීම.
- ඒ අනුව රංග භාණ්ඩයක් නිර්මාණය කිරීම.

පහත සඳහන් කරුණු පිළිබඳ ව සැලකිලිමත් වෙමින් නර්තන අංගයක් නිර්මාණය කර ගනිමු.

- සපයා ගත් ගායනය හා වාද්‍ය ඛණ්ඩ ශ්‍රවණය කර එහි තාලය පිළිබඳ සිතන්න.
- මෙම නර්තනය සඳහා යොදා ගන්නා චලන ද්‍රවිඩ ආභාසයක් ගෙන ඇති බව සිතට ගන්න.
- රංග භාණ්ඩයක් සමබර කර ගනිමින් නර්තනය කළ හැකි සරල චලන නිර්මාණය කර ගන්න.
- අවශ්‍ය අවස්ථාවල දී ගුරු උපදෙස් ලබා ගත හැකි ය.
- සරල රටාවලට අනුව නිමාවක් ඇති නර්තන අංගයක් නිර්මාණය කර ගන්න.
- තනි තනි ව හෝ කණ්ඩායම් වශයෙන් හෝ නර්තන අංගය පන්ති කාමරය තුළ ප්‍රදර්ශනය කරන්න.
- මෙම නර්තන අංගය පුහුණුවීමෙන් ඔබගේ සිරුරේ සමබරතාව, ඉවසීමේ ගුණය, දරා ගැනීමේ හැකියාව යනා දී ගුණාංග වර්ධනය කර ගැනීමට හැකි ය.

## රාමසාන් උත්සවය

රාමසාන් උත්සවය අරාබිය, මැලේසියාව, ඉන්දුනීසියාව, ඉන්දියාව, ශ්‍රී ලංකාව ආදි රටවල වෙසෙන ඉස්ලාම් බැතිමතුන්ගේ උත්සවයකි. මුස්ලිම් ආගමික නීතිය අනුව සෑම ඉස්ලාම් භක්තිකයකු විසින් ම අනිවාර්යයෙන් ම රැකිය යුතු නෝම්බි ඇල්ලීම හෙවත් උපවාස ශීලය මාසයක් පුරා ආරක්ෂා කර අවසන් කරන දිනය රාමසාන් උත්සව දිනය යනුවෙන් හැඳින්වේ. මෙම උපවාස ශීලය ආරම්භ වීමට හේතු වී ඇත්තේ ඉස්ලාම් ආගමිකයන්ගේ ශුද්ධ වූ ග්‍රන්ථය වන 'අල් කුර් ආනය'' ලොව පහළ වූ කාලය සිහිපත් කිරීමේ අභිප්‍රායය යි. ස්ත්‍රී පුරුෂ භේදයකින් තොර ව සෑම ඉස්ලාම් භක්තිකයකු විසින් ම අනිවාර්යයේ ම කළ යුතු මෙකී උපවාසය සඳහා අවු. 07ට අඩු වයස්වල දරුවන්ට, ශරීර ශක්තියෙන් දුර්වල රෝගීන්ට හා වයස්ගත වූවන්ට අවසර නොලැබේ.

උදෑසන හිරු උදාවත් සමඟ ප්‍රථම යාඥාවෙන් ආරම්භ කරන උපවාසය හිරු බැස ගිය පසු නිමා කොට ආහාර පිළියෙළ කරගෙන දවසේ එක ම ආහාර වේල අනුභව කිරීම

මොවුන්ගේ සිරිතකි. උපවාස කාලය ආගමික කටයුතු සඳහා වෙන් වූ කාලයක් බැවින් මේ මාසයේ දී ඉතා ම භක්තියෙන් හා කැපවීමෙන් ආගමික කටයුතු සඳහා වැඩි අවධානයක් යොමු කිරීමට ඉස්ලාම් භක්තිකයෝ යොමු වෙති.

අල්ලාහ් දෙවියන්ගේ ආශීර්වාදය මත මේ කාලයේ දුප්පත් පොහොසත් භේදයකින් තොර ව තමන් පිළියෙළ කර ගන්නා ආහාර, ධන ධාන්‍ය වස්තු ඇඳුම් පැළඳුම්, බෙදා හදා ගැනීමෙන් බොරු කීම, මත්පැන් පානය කිරීම වැනි දුශ්චරිතවලින් මිදීමෙන් උපවාස ශීලය රැකීම මෙහි සුවිශේෂ ලක්ෂණයකි. එමෙන් ම මානසික සංවර බව, කායික සංවර බව ද ඇති කොට ගෙන යහපත් ජීවිතයක් ගත කිරීම සඳහා වසරකට වරක් යොමු වන මේ උපවාස කාලය (නෝම්බි ඇල්ලීම) ජුනි මාසයේ පෝ දින සඳ බැලීමෙන් පසු ව යළි ජූලි මාසයේ පෝ දින සඳ බැලීමෙන් අවසන් වේ.

නෝම්බි අවසන් වූ පසු සිංහල අලුත් අවුරුදු චාරිත්‍ර මෙන් නෑදෑ හිතවතුන්ගේ නිවෙස්වලට යාම ද සිදු කරනු ලැබේ. මේ අනුව ඉස්ලාම් බැතිමතුන්ගේ සමඟිය වර්ධනය වීමත්, ආගමික වශයෙන්, ජාතික වශයෙන් එක් වී දියුණුව සඳහාත් ''රාමසාන් උත්සවය'' දෙවියන් වහන්සේගෙන් ඔවුනට ලැබුණ සැබෑ ආදර්ශයක් ලෙස සලකති.

# 7 පරිච්ඡේදය

## 7.0 අත්දැකීම් ඇසුරු කරගනිමින් ප්‍රාසංගික කලාංග නිර්මාණය

### ගීතයක සුවිශේෂතා

අද වෙස්සන්තර රාජ පුතා .......................... ගීතය
වෙසක් කැකුළු අතු අග .............................. ගීතය

අඩංගු CD පටයක්/ගුරුවරයා විසින් හෝ සිසුවකු විසින් හෝ කරන ලද ගායනයට සවන් දීම.

### අද වෙස්සන්තර රාජ පුතා ගීතය

| | | |
|---|---|---|
| පද රචනය | : | නීතිඥ ජෝන් ද සිල්වා සූරීහු |
| ගීත ගායනය | : | ජෝන් ද සිල්වා නාට්‍ය කණ්ඩායම |

මෙය නූර්ති ගීතයකි. වෙස්සන්තර හා මන්ද්‍රී දේවියගේ විවාහය තේමා කරගත් ගීතයකි.

මෙම ගීතය ඇතුළත් වී ඇත්තේ වෙස්සන්තර ජාතක කථාව ඇසුරෙන් නීතිඥ ජෝන් ද සිල්වා සූරීන් විසින් රචනා කරන ලද වෙස්සන්තර නූර්ති නාට්‍යයේ ය.

### වෙසක් කැකුළු ගීතය

| | | | | |
|---|---|---|---|---|
| පද රචනය | : | මර්සලීන් ජයකොඩි පියතුමා | | |
| සංගීත නිර්මාණය | : | තනු නිර්මාණය | - | සුනිල් සාන්ත මහතා |
| | | සංගීත නිර්මාණය | - | බී.ඇස්. පෙරේරා මහතා |
| ගීත ගායනය | : | ඉන්ද්‍රාණී විජේබණ්ඩාර මහත්මිය | | |

සරල පද රචනයෙන් මෙන් ම ගී තනු සරල බවින් ද යුත් මේ ගීතය ඇතුළත් වන්නේ චිත්‍රපට සංගීතයේ සන්ධිස්ථානයක් ලෙස සැලකෙන 1956 නිෂ්පාදනය වූ 'රේඛාව' නම් චිත්‍රපටියේ ය.

## ගීතයට අනුව නර්තන නිර්මාණ සඳහා උපදෙස්

- දැන් ඔබ කැමැති පරිදි මේ ගීත දෙකෙන් එකක් තෝරා ගන්න.
- කණ්ඩායම්වලට බෙදී හෝ තනි තනි ව ම හෝ තෝරා ගත් ගීතයට චලන නිර්මාණය කරන්න.

එහි දී පහත සඳහන් උපදෙස් අනුගමනය කරමින් නර්තනය නිර්මාණය කරගන්න.

- ගීතයේ අදහසට අනුව හෝ ඔබ කැමති ආකාරයට හෝ චලන නිර්මාණය කරගන්න.
- සංගීත ඛණ්ඩ සඳහා ද සුදුසු චලන යොදා ගනිමින් නර්තනය අලංකාර කරගන්න.
- ගීතයේ අදහසට අනුව චලන යොදා ගැනීමේ දී මුහුණේ ඉරියවු කෙරෙහි ද අවධානය යොමු කරන්න.
- චලන නිර්මාණය කිරීමේ දී පාසලට ගැළපෙන ආකාරයට චලන සකස් කර ගැනීමට සැලකිලිමත් වන්න.
- අවකාශ භාවිතයේ දී දිසා, තල, රටා පිළිබඳ අවධානය යොමු කරන්න.
- අවශ්‍ය අවස්ථාවල දී ගුරුවරයාගේ සහයෝගය ලබා ගැනීමට හැකි ය.
- කණ්ඩායම්වල දී අන් අයගේ අදහස්වලට ද ගරු කරමින් සාමූහික ව නර්තනයේ යෙදෙන්න.
- කණ්ඩායම් අනුව හෝ තනි තනි ව ඔබගේ නිර්මාණ ඉදිරිපත් කරන්න.

### කාර්ය පත්‍රිකා

1. මෙම ගීත ශ්‍රවණය කිරීමේ දී ඔබ සිතට දැනුණු අදහස් දෙකක් ලියන්න.
   1.
   2.

2. දවට ගහමුදුනේ සිට හඬන පක්ෂියා නම් කර පක්ෂියකුගේ චලනයන් ඉදිරිපත් කරන්න.

3. එම පක්ෂියාගේ නාදය ඇපට ඇසෙන්නේ ....................................... කාලයේ දී ය.

4. ගීතයට අනුව ''ලොව ම අවදි වෙමින් අමුතු පණක් ලබන්නේ'' කුමන හේතු නිසා ද?
   1.
   2.
   3.

5. වෙස්සන්තර නූර්ති නාට්‍යය රචනා කරන ලද්දේ කුමන ජාතික කථාව ඇසුරු කර ගනිමින් ද?

6. යා කරන්න.

| | |
|---|---|
| 1. වෙසක් කැකුළු ගීත ගායනය | මර්සලීන් ජයකොඩි පියතුමා |
| 2. වෙස්සන්තර නාට්‍ය | ඉන්ද්‍රාණි විජේබණ්ඩාර මහත්මිය |
| 3. ගීත රචකයෙකි | වෙස්සන්තර කුමරු මන්ද්‍රි කුමරි |
| 4. චරිත දෙකකි | නීතිඥ ජෝන් ද සිල්වා මහතා |

## ගීතය - වෙසක් කැකුළු

වෙසක් කැකුළු අතු අග ඉඳ නටන විලාසේ
ඉරෙන් හඳෙන් සිරි විඳ විඳ රඟන විලාසේ //

පියලි සලාලා රේණු සලාලා සුවඳ උරා සිසිල් සුළං හමන්නේ
ලොව ම අවදි වෙමින් අමුතු පණක් ලබන්නේ //

දවට ගහේ ගහ මුදුනේ කොහා අඬන්නේ
කෑරලා ද නාද දෙමින් ගහට කොටන්නේ //

ටිං ටිං සද්දේ ඒ මැද ඇත්තේ
ගම වට කර කුරුලු ගීත ඇසෙන්නේ
ලොව ම අවදි වෙමින් අමුතු පණක් ලබන්නේ//

කදා වළලු දෑත දිගේ ටිකිරි ලියන්නේ
ටිකිරි ටිකිරි වළලු හඬ යි ළපටි ළඳුන්ගේ//

ගීත ගයන්නේ ගයා නටන්නේ
කොලු කෙලි පොඩි ගී ගයමින් නටන්නේ
ලොව ම අවදි වෙමින් අමුතු පණක් ලබන්නේ //

## ගීතය - අද වෙස්සන්තර රාජ පුතා

අද වෙස්සන්තර රාජ පුතා
මන්ද්‍රී කුමාරි බඳී
දේවෝපකාරේ වේවා සෑදී සෙත්
රටවැස්සන්ගේ කාලෙ හොඳා
දුර්භික්ෂ යාය සිඳී
මංගල්ලේ සාරවෙවා සෑදීසෙත්
බෝම ප්‍රීති සෝෂා ඇසෙන්නා මේ සිව් දිසා
සෙත අත්පත් වේවා මන්ද්‍රි කුමරිහට දන්
රාජ සම්පත් නොමින් දේය රාජා උතුම්
කුමරාගේ පිනක් මයි
වාසනා බෝ.......... වාසනා බෝ

## සැරසිලි අංගයන් නිර්මාණය

- හත් අඩියේ භාවිත වන පියුම්
- ගොප් කොළ නෙළුම් මල
- ගොප් කොළ කුරුල්ලා

මේවා ඉතා පහසුවෙන් සරල ව නිර්මාණය කළ හැකි නිර්මාණ බැවින් පහත සඳහන් රූප සටහන් ආධාරකයක් ලෙස භාවිත කොට නිර්මාණය කරන්න.


(1)


(2)


(3)

අවශ්‍ය ද්‍රව්‍ය :

ගොප් කොළ
මේරූ වියළි කොළ (පොල් කොළ)
කෙසෙල් කොට කැබැල්ලක්
ඉරටු
පිහියක්

- 1 රූපයේ දැක්වෙන ආකාරයට ගොප් කොළ සහ පොල් කොළ කපන්න.
- කපාගත් ගොප් කොළ සහ පොල් කොළ අංක (2) රූපයේ දැක්වෙන පරිදි දිග හැර ගන්න.
- ඒ අනුව ගොප් කොළ සහ පොල් කොළ අවශ්‍ය ප්‍රමාණයට කපා දිග හරින්න.
- ගොප් කොළවලින් සහ පොල් කොළවලින් අවශ්‍ය ප්‍රමාණයට කොළ කපා ගන්න.
- කෙසෙල් කොට කැබැල්ලක් (අඟල් 5ක් උසට සකස් කර ගන්න.)
- කපා ගන්නා ලද කොළ අංක 3 රූපයේ දැක්වෙන පරිදි කෙසෙල් කොට කැබැල්ලේ උඩ මුහුණතෙහි ඉරටු තුඩෙන් රඳවන්න.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


| | | |
|---|---|---|
| උඩරට නැටුම් කලාව | - | සේදරමන්, ජේ.ඊ.<br>ඇම්.ඩී. ගුණසේන සහ සමාගම<br>කොළඹ 1979 |
| නර්තනයට අත්වැලක් | - | ජා.අ.ආ.<br>ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය 2000 |
| නර්තනය 10 ශ්‍රේණිය | - | මල්ලවආරච්චි, ස්ටැන්ලි ශ්‍රේෂන්<br>මල්පියළි 2000 |
| පහතරට නැටුම් | - | සච්රිස් සිල්වා, එස්.එච්.<br>එම්.ඩී. ගුණසේන 1965 |
| සබරගමු නැටුම් කලාව | - | කේ.ඊ. සුසිලරත්න<br>සෙනරත් ප්‍රකාශන 2006 |
| සිංහල නර්තන කලාව | - | දිසානායක, මුදියන්සේ<br>ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ<br>1998 |